84 වන කාණ්ඩය
9 වන කලාපය

ඉරිදා
1969 මැයි 4

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 1661]

තේ ප්‍රචාරක (සංශෝධන) පනත් කෙටුම්පත [තී. 1680] :
පළමුවන වර කියවන ලදී.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා [තී. 1681]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 84
இல. 9

ஞாயிற்றுக்கிழமை
4 மே 1969

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்


வினுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 1661]

தேயிலைப் பிரசார (திருத்த) மசோதா [ப. 1680] :
முதன்முறை மதிப்பிடப்பட்டது.

தனி அங்கத்தினர் பிரேரணைகள் [ப. 1681]


---

Volume 84
No. 9

Sunday
4th May 1969

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS [Col. 1661]

TEA PROPAGANDA (AMENDMENT) BILL [Col. 1680] :
Read the First time

PRIVATE MEMBERS' MOTIONS [Col. 1681]



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## House of Representatives

### 1969 මැයි 4 වන ඉරිදා

ஞாயிற்றுக்கிழமை, 4 மே 1969

*Sunday, 4th May, 1969*

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [එම්. සිවසිතම්පරම් මයා.] මූලාසනාරූඪ විය.

சபை, பி. ப. 2 மணிக்குக் கூடியது. உப சபாநாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.

*The House met at 2* P.M., MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *in the Chair.*

---

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

## வினாக்களுக்கு வாய்மூல விடைகள்

## ORAL ANSWERS TO QUESTIONS

### වලවේ යෝජනා ක්‍රමයේ මිනින්දෝරුවන් : අධ්‍යයන නිවාඩු

அளவையாளர், வளவேத்திட்டம் : கல்வி விடுமுறை

**SURVEYORS, WALAWE SCHEME : STUDY LEAVE**

4. **බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයට අයත් වලවේ යෝජනා ක්‍රමයේ සේවයේ යෙදී සිටින මිනින්දෝරුවන්ගෙන් කී දෙනෙක් දියතලාවේ මිනුම් සහ සිතියම් ආයතනයේ අවුරුද්දක පුහුණුව සඳහා තෝරා ගනු ලැබ සිටිත් ද? (ආ) ඔවුනට අධ්‍යයන නිවාඩු දී තිබේද? (ඉ) ඔවුනට වැටුප් සහිත අධ්‍යයන නිවාඩු දීමට අපහසු නම් වැටුප් රහිත අධ්‍යයන නිවාඩු දීමට එතුමා ක්‍රියා කරනවාද? (ඊ) නො එසේ නම්, ඒ මන්ද?

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) ஆற்றுப்படுக்கை அபிவிருத்திச் சபையைச் சேர்ந்த வளவே திட்டத்தில் சேவைபுரியும் அளவையாளர்களில் எத்தனை பேர் தியதலாவை அளவையில் நிலப்படம் வரைதல் நிலையத்தில் ஒரு வருட பயிற்சிக்காகத் தெரிவு செய்யப்பட்டுள்ளனர்? (ஆ) அவர்களுக்கு கல்வி விடுமுறை அளிக்கப்பட்டுள்ளதா? (இ) அவர்களுக்கு வேதனத்துடன் கூடிய கல்வி விடுமுறை அளிக்க முடியாதெனில், வேதனமற்ற கல்வி விடுமுறை அளிக்க அவர் நடவடிக்கை எடுப்பாரா? (ஈ) அப்படியின்றேல், ஏன்?

asked the Minister of Land, Irrigation and Power: (*a*) How many of the surveyors at the Walawe Scheme of the River Valleys Development Board have been selected for a year's training at the Institute of Surveying and Mapping in Diyatalawa? (*b*) Have they been granted study leave? (*c*) If it is difficult to grant them full pay study leave, will he consider granting them no-pay study leave? (*d*) If not, why?

**එන්. විමලසේන මයා.** (මුදල් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්—ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති වෙනුවට)
*(திரு. என். விமலசேன—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி, காணி, நீர்ப்பாசன மின்விசை அமைச்சர் சார்பாக)*
(Mr. N. Wimalasena—Parliamentary Secretary to the Minister of Finance—on behalf of the Minister of Land, Irrigation and Power)

(අ) 5. (ආ) නැත. (ඉ) මිනින්දෝරුවරුන්ගේ හිඟය නිසා, දියතලාවේදී පුහුණුවීමේ පාඨමාලාව අනුගමනය කිරීම පිණිස කිසිම මිනින්දෝරුවකු මුදවා හැරීමට නුපුළුවන. (ඊ) අදාළ නොවේ.

### වලවේ යෝජනා ක්‍රමයේ මිනින්දෝරුවන් : වැඩ

அளவையாளர், வளவேத்திட்டம் : கடமைகள்

**SURVEYORS, WALAWE SCHEME : DUTIES**

5. **තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) වලවේ සංවර්ධන යෝජනා ක්‍රමයට සම්බන්ධ වූ මිනින්දෝරුවන්ගේ සංඛ්‍යාව කොපමණද? (ආ) මේ මිනින්දෝරුවනට සැහෙන



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]
ප්‍රමාණ වැඩ නැති නිසා ඔවුන්ගේ උනන්දුව හා ධෛර්යයද හීන වී ඇති බව එතුමා දන්නවාද? (ඉ) මේ මිනින්දෝරුවන්ගෙන් ලබාගත හැකි උපරිම සේවාව ලබා ගැනීමට හැකි වන පරිදි, දැනට පවත්නා දුබල පාලන පිළිවෙල වෙනස් කිරීමට එතුමා ක්‍රියා කරනවාද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) வளவே அபிவிருத்தித் திட்டத்தைச் சேர்ந்த அளவையாளர்களின் எண்ணிக்கை யாது? (ஆ) இவ்வளவையாளர்களுக்குப் போதிய வேலை அளிக்கப்படாததால், அவர்கள் வேலையில் சிரத்தையையும், உற்சாகத்தையும் இழந்திருக்கின்றனர் என்பதை அவர் அறிவாரா? (இ) இவ்வளவையாளர்களிடமிருந்து பெறக்கூடிய ஆகக்கூடிய சேவையைப் பெறக்கூடியதாக, தற்பொழுது நிலவி வரும் நிர்வாகச் சீர்கேட்டை மாற்றுவதற்கு அவர் ஆவன செய்வாரா?*

asked the Minister of Land, Irrigation and Power: (a) How many surveyors are attached to the Walawe Development Scheme? (b) Is he aware that these surveyors have lost interest and have become disheartened as sufficient work is not provided for them? (c) Will he take action to change the inefficient administration that prevails so as to obtain the best possible service from these surveyors?

**විමලසේන මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති වෙනුවට)**
*(திரு. விமலசேன—காணி நீர்ப்பாசன. மின்விசை அமைச்சர் சார்பாக)*
(Mr. Wimalasena—on behalf of the Minister of Land, Irrigation and Power)

(අ) 37. (ආ) නැත. (ඉ) පැන නොනගී.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මට අතුරු ප්‍රශ්නයක් අසන්නට තිබෙනවා. මගේ "ආ" යන්නට උත්තරය "නැත" යන්නයි. එහෙත් මට දැනගන්නට ලැබී ඇති ලෙසට වලවේ සංවර්ධන යෝජනා ක්‍රමයට සම්බන්ධ මිනින්දෝරු මහත්වරුන් කිසිම වැඩක් නැතුව කාලය මරමින් සිටින බවයි කියන්නට තිබෙන්නේ. එම දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවන්ගෙන්ම දැනගන්නට ලැබී තිබෙන කාරණයක් මේක. එම නිසා මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා ඔවුන්ගේ ශක්තිය වලවේ සංවර්ධන යෝජනා ක්‍රමය වෙනුවෙන් නිසි පරිදි යොදවන්න. එසේ නැතිනම් ලංකාවේ මිනින්දෝරුවන් අඩු පළාත්වල සේවය සඳහා ඔවුන් යවන්න.

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)

ඔවුන්ගේ සේවය අඩපණ වෙලාය කියා ඇමතිතුමාට ආරංචියක් නැහැ. කෙසේ වෙතත් මේ කාරණය ඇමතිතුමාට දන්වන්නම්.

## සීමාසහිත ජෝර්ජ් ස්ටුවට් සහ සමාගම: විධායක නිලධාරියකු පුහුණු කිරීමට විදේශ විනිමය ඉල්ලීම

ஜோர்ஜ் ஸ்டுவர்ட் அண்ட் கம்பெனி லிமிடெட்: நிறைவேற்றுனர் பயிற்சிக்கு வெளிநாட்டுச் செலாவணிக்கோரிக்கை

GEORGE STEUART & CO. LTD.: APPLICATION FOR FOREIGN EXCHANGE FOR TRAINING EXECUTIVE

6. **ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට)
*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)*
(Dr. N. M. Perera—Yatiyantota)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) සීමාසහිත ජෝර්ජ් ස්ටුවට් සහ සමාගම ස්වකීය විධායක නිලධාරීන්ගෙන් කෙනෙකු හාවඩ් විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර අංශයෙහි උසස් කළමනාකාරීත්වය පිළිබඳ සිව් මසක පුහුණුවක් ලැබීම සඳහා යැවීමට අවසර ඉල්ලූ බව එතුමා දන්නේ ද? (ආ) මෙම සිව් මසක පාඨමාලාව සඳහා එක්සත් ජනපද ඩොලර් 7589 ක් නිකුත් කරන ලෙස මෙම සමාගම ඉල්ලා ඇති බව එතුමා දන්නේ ද? (ඉ) මෙම මුදල් ප්‍රමාණය සෑදී ඇත්තේ පහත දැක්වෙන අයුරින් බව එතුමා දන්නේ ද? අධ්‍යයන 3,000, කාමරය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

500, නිදන ශාලාව 390, පංක්ති සමිති ගෙවීම් 200, විවිධ 1,000, එක්සත් ජනපදයට යාමේ හා පෙරළා පැමිණීමේ ගමන් ගාස්තුව 1,170, එක්සත් ජනපදය තුළ ගමන් වියදම් 1,329 (ඊ) පැහැදිලිව ම පෙනෙන පරිදි, අවශ්‍ය මුදල් ප්‍රමාණයට වඩා බොහෝ අධික මුදලක් මෙම සමාගම විසින් ඉල්ලා ඇති හෙයින්, මෙම ඉල්ලීමට ඉඩ නොදෙන බවට එතුමා වග බලා ගන්නේ ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) ஹார்வாட் சர்வகலாசாலையிலே, வணிகப் பகுதியிலே உயர்தர முகாமையில் நான்கு மாதப் பயிற்சி பெறுதற்கென தம் நிறைவேற்றுனர் ஒருவரை அனுப்புதற்கு "ஜோர்ஜ் ஸ்டுவர்ட் அண்ட் கம்பனி லிமிடெட்" தாபனத்தார் அனுமதி கோரினதை அவர் அறிவாரா? (ஆ) இந்நான்கு மாதப் பயிற்சித் தொடருக்கு 7,589 அமெரிக்க டொலர்களை கொடுக்கும்படி இத்தாபனம் கேட்டதை அவர் அறிவாரா? (இ) இத்தொகையின் மூல விபரங்கள் பின்வருமாறு என்பதை அவர் அறிவாரா: படிப்பு 3000, அறை 500, படுக்கைக்கூடம் 390, வகுப்புச் சங்கக் கட்டணங்கள் 200, பலவின செலவு 1,000, அமெரிக்கா பயணச் செலவு 1,170, அமெரிக்காவில் பயணச் செலவு 1,329 (ஈ) இத்தாபனத்தின் இக்கோரிக்கை மிகைப்பட்டது என்பது வெளிப்படையானதால் இம்மனுவை ஏற்றுக்கொள்ளாது விடுவதை உறுதிப்படுத்துவாரா?

asked the Minister of Finance: (*a*) Is he aware that George Steuart & Co. Ltd. applied for permission to send one of its executives to undergo training for four months in advance management at the business section of Harvard University? (*b*) Is he aware that this company has asked for a release of 7589 U.S. dollars for this four months' course? (*c*) Is he aware that the break-down of this amount is as follows:

| | |
|---|---|
| Tuition .. | .. 3,000 |
| Room .. | .. 500 |
| Dormitory .. | .. 390 |
| Class Association Dues | .. 200 |
| Miscellaneous | .. 1,000 |
| Passage re. U.S. | .. 1,170 |
| Travel in U.S. | .. 1,329 |

(*d*) In view of the obvious exaggerated claim made by this company, will he see that this application is not allowed?

**විමලසේන මයා.**
(திரு. விமலசேன)
(Mr. Wimalasena)

(*a*) Yes. (*b*) Yes. (*c*) Yes. (*d*) Under current Exchange Control practice exchange facilities are provided to senior executives of commercial establishments for higher management study provided it is of positive value to the country and promotes its economic development. This is subject to FEECs. The application of Messrs. George Steuart & Co. Ltd. has been allowed. The exchange released has been according to current entitlements and not entirely according to the claims made by Messrs. George Steuart & Co. Ltd.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Do you realize that you are sanctioning very nearly Rs. 45,000 for four months? You do not allow this to Ceylonese who go for study abroad. Why this special concession for Messrs. George Steuart & Co.?

**විමලසේන මයා.**
(திரு. விமலசேன)
(Mr. Wimalasena)

Their entire request has not been granted. As I have already stated under (*d*), it is in terms of the current entitlement.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

For tuition it costs nearly 3,000 dollars.

**විමලසේන මයා.**
(திரு. விமலசேன)
(Mr. Wimalasena)

Whatever it is, I cannot give the exact figures. They have been asking for $7,589. What has been allowed is $4,052. in addition to passage.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වී. එන්. නවරත්නම් මයා.** (චාවකච්චේරි)

*(திரு. வி. என். நவரத்னம்—சாவகச்சேரி)*

(Mr. V. N. Navaratnam—Chavakachcheri)

One of the greatest drawbacks we have in the agricultural and commercial sectors is the dearth of people who are qualified in business management. Whilst complimenting Messrs. George Steuart & Co. Ltd. for taking this initiative, will the hon. Parliamentary Secretary assure the House that more Ceylonese will be given this exchange to follow similar courses both at this university and in other similar well-reputed universities ?

**විමලසේන මයා.**

*(திரு. விமலசேன)*

(Mr. Wimalasena)

In point of fact, the Government has recognized the need and liberalized the grant of exchange for the purpose of acquiring this expertise at very high management level, and our present policy is to allow a quota of five people a year.

**රත්නපුර සහකාර පළාත් පාලන කොමසාරිස් වෙනුවෙන් පෙනී සිටි රජයේ නීතිඥ තැනගේ ක්‍රියා කලාපය**

*இரத்தினபுரி உ. உ. ஆ. சார்பிலான முடிக்குரிய வழக்கறிஞரின் போக்கு*

CONDUCT OF CROWN COUNSEL APPEARING FOR A.C.L.G., RATNAPURA

7. **සී. එන්. මැතිව් මයා.** (කොළොන්න)

*(திரு. சி. என் மதியூ—கொலன்னா)*

(Mr. C. N. Mathew—Kolonna)

අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) බලංගොඩ නගර සභාවේ සභාපති, ඡන්දයෙන් තෝරා පත් කිරීමේදී රත්නපුර සහකාර පළාත් පාලන කොමසාරිස් උන් තීන්දුවේ නීත්‍යානුකූල භාවය විනිශ්චය කිරීමට



කෙරෙන, ශ්‍රෙෂ්ඨාධිකරණයේ, 1966 වර්ෂයේ අංක 428 දරණ අයදුම්පත (එස්. ඩී. සිරිසේන එරෙහිව එල්. ජී. සිරිවර්ධන හා එම්. එල්. එම්. අබුසාලි) 67. 12. 5 වැනි දින විභාගයට ගත් අවස්ථාවේදී, සහකාර පළාත් පාලන කොමසාරිස් වෙනුවෙන් පෙනී සිටි රජයේ නීතිඥ තැන, (i) සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ ක්‍රියා මාර්ගය තමාට තහවුරු කළ නොහැකි බව උසාවියට ප්‍රකාශ කළ බවත්, (ii) සහකාර පළාත් පාලන කොමසාරිස් ගේ දිවුරුම් පෙත්සම උසාවියට ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ බවත්, එතුමා දන්නවා ද? (ආ) සහකාර පළාත් පාලන කොමසාරිස් වෙනුවෙන් පෙනී සිටීමට රජය භාර නොගන්නා බව ඇටෝර්නි ජනරාල්, කාර්ය සංවිධාන සංග්‍රහයේ ව්‍යවස්ථා 74 (4) න් නියම කෙරෙන පරිදි, අධිකරණ ඇමතිටත්, සහකාර පළාත් පාලන කොමසාරිස්ටත් දන්වූයේ ද? (ඉ) ඇටෝර්නි ජනරාල්ගේ දෙපාර්තමේන්තුව විසින් කෙරෙන මෙවැනි අතපසුවීම් වැළැක්වීමට එතුමා ගන්නට අදහස් කරන පියවර කවරේ ද? (ඊ) සහකාර පළාත් පාලන කොමසාරිස් විසින් ගෙවීමට නියම වූ නඩු ගාස්තු, මහජන මුදල්වලින් ගෙවන ලද්දේ ද?

*நீதியமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) (எஸ். டி. சிறிசேன என்பவர் எல். ஜீ. சிறிவர்தன, எம். எல். எம். அபுசாலி என்பவர்களுக்கெதிராகத் தாக்கல் செய்த) 1966 ஆம் ஆண்டின் 428 ஆம் இலக்க உயர் நீதிமன்ற விண்ணப்பம் 5.12.67 இல் விசாரிக்கப்பட்ட சமயம் பலான்கொடை நகரசபைத் தலைவர் தேர்தலில் இரத்தினபுரி உள்ளூராட்சி உதவி ஆணையாளரால் அளிக்கப்பட்ட தீர்ப்பின் செல்லுபடியான தன்மை வாதிக்கப்பட்டபோது,*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

உள்ளூராட்சி உதவி ஆணையாளர் சார்பிலான முடிக்குரிய வழக்கறிஞர்—(i) அவரது செயலைத் தாம் ஆதரிக்க முடியாதென்று நீதிமன்றத்திற் கூறியதுடன், (ii) உள்ளூராட்சி உதவி ஆணையாளரின் சத்தியவோலையை சமர்ப்பிக்கத் தவறினரென்பதையும், அவர் அறிவாரா? (ஆ) முடிக்குரிய வழக்கறிஞர் உள்ளூராட்சி உதவி ஆணையாளரின் கட்சியை ஏற்க மாட்டாரென்பதை நடைமுறைக் கைநூலின் 74 (4) ஆம் விதியின் ஏற்பாட்டுக்கமைவாக சட்டத்துறைத் தலைமை அதிபதி நீதியமைச்சருக்கும், உள்ளூராட்சி உதவி ஆணையாளருக்கும் தெரிவித்தாரா? (இ) சட்டத்துறைத் தலைமை அதிபதி திணைக்களத்தின் அத்தகைய அசட்டையான செயல்களைத் தடுப்பதற்கு அவர் மேற்கொள்ள உத்தேசிக்கும் நடவடிக்கைகள் யாவை? (ஈ) உள்ளூராட்சி உதவி ஆணையாளருக்கெதிராகத் தீர்க்கப்பட்ட செலவுத் தொகைகள் பொது நிதிகளிலிருந்து கொடுக்கப்பட்டனவா:

asked the Parliamentary Secretary to the Minister of Justice: (*a*) Is he aware that at the hearing on 5.12.67 of Supreme Court Application No. 428 of 1966 (S. D. Sirisena vs. L. G. Siriwardene and M. L. M. Aboosally) where the legality of the ruling given by the A.C.L.G., Ratnapura, at the election of Chairman of Balangoda U.C. was canvassed, the crown counsel who appeared for the A.C.L.G. (i) declared to court that he could not support his action; and also (ii) failed to submit the A.C.L.G.'s affidavit before the court? (*b*) Did the Attorney-General as required by Rule 74 (4) of the Manual of Procedure keep the Minister of Justice and the A.C.L.G. informed of the fact that the Crown would not undertake the A.C.L.G's defence? (c) What steps does he propose to take to prevent such acts of negligence by the Attorney-General's Department? (*d*) Were the costs awarded against the A.C.L.G. paid from public funds?

**එම්. එච්. එම්. නයිනා මරික්කාර් මයා. (අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(ஜனாப் எம். எச். நயினா மரிக்கார்—நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. M. H. M. Naina Marikar—Parliamentary Secretary to the Minister of Justice)

(*a*) (i) Yes. (ii) No affidavit of the A.C.L.G. was necessary since the facts were not in dispute. The question before court related only to the correct interpretation of Section 18 (1) of the Urban Councils Ordinance. (*b*) Does not arise since the A.C.L.G. was represented by crown counsel. (*c*) Does not arise since there was no negligence on the part of the Attorney-General's Department. (*d*) Yes.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Question No. 1.

**නයිනා මරික්කාර් මයා.**
*(ஜனாப் நயினா மரிக்கார்)*
(Mr. Naina Marikar)
On behalf of the Minister of Agriculture and Food, I ask for two weeks' time to answer the Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Question No. 2.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නයිනා මරික්කාර් මයා.**

(ஜனாப் நயினா மரிக்கார்)

(Mr. Naina Marikar)

On behalf of the Minister of Agriculture and Food, I ask for two weeks' time to answer the Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**මහර, හේනේගම, ඊ. පී. සිරියා මහතා**

திரு. ஈ. பி. சிரியா, ஹேனகம, மகற

MR. E. P. SIRIYA, HENEGAMA, MAHARA

3. **එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ) (එස්. කේ. කේ. සූරියාරච්චි මයා.—මහර—වෙනුවට)

(திரு. எம். பீ. டி சொய்ஸா சிறிவர்தன—மினுவாங்கொட—திரு. எஸ். கே. கே. சூரியாரச்சி—மகற—சார்பாக)

(Mr. M. P. de Zoysa Siriwardena—(Minuwangoda)—on behalf of Mr. S. K. K. Suriarachchi—Mahara)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය:

(අ) (i) මහර ඡන්ද දායක කොට්ඨාශයේ හේනේගම කහටානේ පදිංචිව සිටි ඊ. පී. සිරියා යන අය ලංකා අක්ෂිදාන සංගමයට තමාගේ ඇස් දන් දීමට කැමැත්ත නියමිත අන්දමින් ප්‍රකාශ කර තිබුණ බවත්; (ii) මොහු 1969 පෙබරවාරි මස 18 වෙනි දින කාලක්‍රියා කළ බවත්; (iii) ඇස් දන් දෙන්නන්ට දී ඇති උපදෙස් අනුව මොහුගේ ඇස් ඉවත් කිරීමට ගම්පහ රජයේ රෝහලටත්, කොළඹ නයනාරෝග්‍යශාලාවටත්, කොළඹ මහාරෝග්‍යශාලාවටත්, ගරු සෞඛ්‍ය උප ඇමතිණියටත්, මොහු මිය ගිය විගසම දැනුම් දුන් බවත්; (iv) මේ සඳහා යෙදවීමට වෛද්‍යවරුන් නොමැති බව ඒ සෑම ස්ථානයකින්ම ප්‍රකාශ කළ බවත්; (v) එම නිසා තම ජීවිත කාලය තුළ තද බල විශ්වාසයකින් හා බලාපොරොත්තුවකින් ඇස් දන්දීමට සිටි සිරියා මහතාගේ ඇස් දන්දීම භාර ගැනීමට අක්ෂිදාන සංගමය හා රජය අපොහොසත් වූ බවත්; එතුමා දන්නවාද? (ආ) ඇස් දන් දෙන්නන්ගේ ප්‍රබලතම බලාපොරොත්තුව අවසාන වරට ඉටුකර දීම සඳහා රජය මගින් මින් පසු අවශ්‍ය විධිවිධාන යොදනවාද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) மகற தேர்தற்றொகுதியில், ஹேனகம கஹற்றானேவில் வசித்த ஈ. பி. சிரியா என்பவர் இலங்கைக் கண் தானச்சங்கத்திற்கு தமது கண்களை தானஞ் செய்யத் தமது விருப்பத்தை முறையாக அறிவித்திருந்தாரென்பதையும்; (ii) இவர் 1969 ஆம் ஆண்டு பெப்ருவரி மாதம் 18 ஆந் தேதியன்று மரணமடைந்தாரென்பதையும்; (iii) கண் தானஞ் செய்பவருக்கு அளிக்கப்பட்டிருந்த ஆலோசனைகளுக்கிணங்க இவர் மரணமெய்தியவுடனேயே, கண்களை அகற்றுமாறு, கம்பஹா அரசாங்க ஆஸ்பத்திரிக்கும், கொழும்பு கண் வைத்தியசாலைக்கும், கொழும்பு பெரியாஸ்பத்திரிக்கும் கௌரவ சுகாதார உப அமைச்சருக்கும் அறிவிக்கப்பட்டதென்பதையும்; (iv) அறிவிக்கப்பட்ட சகல நிலையங்களிலிருந்தும், இவ்வேலையைச் செய்வதற்கு வைத்தியர்கள் இல்லையெனத் தெரிவிக்கப்பட்டதென்பதையும்; (v) இதன் காரணமாக, திரு. சிரியா தமது வாழ்நாளில், தமது கண்களைத் தானஞ் செய்ய முடியுமென்றிருந்த நம்பிக்கையையும், விசுவாசத்தையும், கண்தானஞ் சங்கமும், அரசாங்கமும் இழக்கச் செய்துள்ளன வென்பதையும் அவர் அறிவாரா? (ஆ) கண்தானஞ் செய்பவர்களின் இலட்சியத்தை இறுதியாகப் பூர்த்திசெய்ய அரசாங்கம் அவசியமான நடவடிக்கைகளை இதன்பின்னர் எடுக்குமா?

asked the Minister of Health: (*a*) Is he aware that (i) E. P. Siriya of Kahatane, Henegama, in the Mahara Electorate, had declared, in the prescribed manner, his intention to donate his eyes to the Ceylon Eye Donation Society; (ii) this person died on 18th February 1969; (iii) according to the instructions given to eye donors, the Government Hospital, Gampaha,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the Eye Hospital, Colombo, the General Hospital, Colombo, and the Parliamentary Secretary to the Minister of Health were informed immediately after his death so that his eyes could be removed ; (iv) each one of the institutions referred to had stated that doctors were not available to be released for this purpose ; (v) as a result, although Mr. Siriya in his living days firmly believed that he would be able to donate his eyes, the Eye Donation Society and the Government failed to accept the donation ? (b) Will Government make the necessary arrangements so that this great expectation of eye donors would be realized ?

**විමලා කන්නන්ගර මිය.** (සෞඛ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

*(திருமதி விமலா கன்னங்கர—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mrs. Wimala Kannangara—Parliamentary Secretary to the Minister of Health)

(අ) (i) නැත. (ii) නැත. (iii) නැත. කොළඹ නයනාරෝග්‍යශාලාව වෙත හෝ ගම්පහ දිස්ත්‍රික් වෛද්‍ය නිළධාරියා වෙත එවැනි ඉල්ලීම් කිසිවක් කර ඇති බවට සටහන් වී නොමැති ය. කෙසේ වුවද නාඳුනන පුද්ගලයකු විසින් මා හට ටෙලිෆෝන් පනිවුඩයකින් දන්වන ලදී. මේ තැනැත්තාගේ මරණයෙන් පසුවයි, එසේ දන්වන ලද්දේ. මා ඒ ගැන ඇස් රෝහලට දැන්වූ නමුත් ඒ සඳහා මුදලීමට වෛද්‍යවරයකු ලබාගත නොහැකි බව ඇස් රෝහලේ නිලධාරීන් විසින් මා වෙත දන්වන ලදී. (iv) පැන නො නඟී. (v) පැන නො නඟී. (ආ) අක්ෂිදාන සංගමය පෞද්ගලික සංවිධානයක් වන අතර, කොළඹ ඇස් රෝහලේ සේවය කරන රජයේ වෛද්‍ය නිළධාරීන් හුදෙක් සිය කැමැත්තෙන්ම මෙම සමිතියට ආධාර දෙනු ලැබේ.

## ඇමතිවරුන් හා පාර්ලිමේන්තු ලේකම්වරුන් නිල රථ පාවිච්චිය

*அமைச்சர்களும் பாராளுமன்றக் காரியதரிசிகளும் உத்தியோக ரீதியான வாகனங்கள் உபயோகித்தல்*

**USE OF OFFICIAL VEHICLES BY MINISTERS AND PARLIAMENTARY SECRETARIES**

8. **ද සොයිසා සිරිවර්ධන මයා.** (ටී. බී. ඉලංගරත්න මයා.—කොලොන්නාව—වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னாவ—சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. T. B. Ilangaratne—Kolonnawa)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ඇමතිවරුන් හා පාර්ලිමේන්තු ලේකම්වරුන් නිළ රථ පාවිච්චි කිරීමේදී අනුගමනය කළ යුතු රීති මාලාදියක් තිබේ ද? (ආ) එසේ නම්, ඒවා මොනවා ද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) அமைச்சர்களும், பாராளுமன்றக் காரியதரிசிகளும் உத்தியோகரீதியான வாகனங்களை உபயோகிக்கும் பொழுது பின்பற்ற வேண்டிய விதிகள் உளவா? (ஆ) ஆமெனில், அவை யாவை?*

asked the Minister of Finance: (a) Are there any rules or regulations governing the use of official vehicles by Ministers and Parliamentary Secretaries ? (b) If so, what are they ?

**විමලසේන මයා.**

*(திரு. விமலசேன)*

(Mr. Wimalasena)

(අ) එසේය. (ආ) (i) මූ. රෙ. 1640 (ශුඩි පත්‍ර අංක 38, ii වැනි කොටස) සියළුම රජයේ දෙපාර්තමේන්තුවල වාහන පොදු රාජකාරි කටයුතු සඳහා රජයේ නිලධාරීන්ගේ ප්‍රයෝජනය පිණිසම ඇති බව එහි සඳහන් වේ. (ii) ඇමතිවරුන්, පාර්ලිමේන්තු ලේකම්වරුන් සහ රජයේ නිලධාරීන් රාජකාරි කටයුතු සඳහා යන එන ගමන් වල දී යම් කිසි අනියම් පුද්ගලික ගමනක් යැමට සිදුවුවහොත් ඒ සඳහා මූ. රෙ. 1640 (iv) (ශුඩි පත්‍ර අංක 38, ii වැනි කොටස) යටතේ දෙපාර්තමේන්තුවක් සතු මෝටර් වාහන යොදාගත හැකි බව අංක 670 හා දාතම 65.10.13 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ සඳහන් වේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

## මිහින්තලේ විදුහල් සඳහා විද්‍යාගාර

மிகிந்தலைப் பாடசாலைகளுக்கு விஞ்ஞான கூடங்கள்

LABORATORIES FOR MIHINTALE SCHOOLS

9. ද සොයිසා සිරිවර්ධන මයා. (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.—මිහින්තලේ—වෙනුවට)

(திரு. டி. சொய்஭ா சிறிவர்தன—திரு. பீ. எம். கே. தென்னக்கூன்—மிகிந்தலை—சார்பாக)

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. P. M. K. Tennekoon—Mihintale)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මිහින්තලා ආසනයේ මහ විදුහල් සඳහා පසුගිය රජයෙන් සිවලාකුලම හා ගල්කුලම යන මහ විදුහල් දෙකෙහි විද්‍යාගාර දෙකක් පිහිටුවීමෙන් පසු, මේ දක්වා ඉතිරි එකම මහ විදුහලකටවත් විද්‍යාගාරයක් නුදුන් බව එතුමා දන්නවා ද? (ආ) හැකිතාක් ඉක්මණින් මිහින්තලේ, ගන්තිරියාගම, පානියන්කඩවල හා ලබුනෝරුව යන මහ විදුහල් සඳහා විද්‍යාගාර පිහිටුවීමට එතුමා ක්‍රියා කරනවා ද? (ඉ) එසේ නම්, කවදා ද? නොඑසේ නම්, හේතු කවරේ ද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) மிகிந்தலைத் தொகுதியில் மகாவித்தியாலயங்களுக்கென முன்னைநாள் அரசாங்கம் சிவலாகுளம், கல்குளம் ஆகிய இரு மகாவித்தியாலயங்களுக்கு இரு விஞ்ஞான கூடங்களை அமைத்துக் கொடுத்ததன் பிறகு, எஞ்சியிருக்கும் மகாவித்தியாலயங்களுக்கு ஒரு விஞ்ஞான கூடமாவது இது வரை அமைத்துத் தரப்படவில்லையென்பதை அவர் அறிவாரா? (ஆ) கூடிய விரைவில் மிகிந்தலையிலுள்ள கந்திரியாகமை, பானியன் கடவலை, லபுநோருவை ஆகிய மகாவித்தியாலயங்களுக்கு விஞ்ஞான கூடங்களை நிறுவ அவர் நடவடிக்கை எடுப்பாரா? (இ) ஆமெனில், எப்பொழுது; இல்லையெனில், ஏன்?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that since two laboratories were set up in the Sivalakulama and Galkulama Maha Vidyalayas by the Previous Government, in respect of the maha vidyalayas in the Mihintale Electorate no other maha vidyalaya in the electorate has been provided with a laboratory to date? (*b*) Will he take early action to provide laboratories to the Mihintale, Gantiriyagama, Paniyankadawala and Labunoruwa Maha Vidyalayas? (*c*) If so, when? If not, why?

ගාමණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(අ) ඔව්. (ආ) නැත. (ඉ) විද්‍යාලවල විද්‍යාගාර සැපයීමට අවශ්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව දැනට නැත.

## පයිරිමඩුවට දිස්පැන්සරියක්

பயிரிமடுவைக்கு மருந்தகம்

DISPENSARY FOR PAIRIMADUWA

10. ද සොයිසා සිරිවර්ධන මයා. (පී. එම්. කේ. තෙන්නකෝන් මයා. වෙනුවට)

(திரு. டி. சொய்஭ா சிறிவர்தன—திரு. பீ. எம். கே. தென்னக்கூன் சார்பாக)

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. P. M. K. Tennekoon)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මිහින්තලා ආසනයේ පයිරිමඩුව හා ඒ අවට වාසි දසදහස් ගණනක ගැමි ජනතාවගේ යහපත පිණිස පයිරිමඩුවේ දිස්පැන්සරියක් ඇති කිරීම මැනවැයි අනුරාධපුර දිස්ත්‍රික් සම්බන්ධතා කමිටුව කළ නිර්දේශය අනුව ඒ සඳහා ඉඩම් අක්කර පහක් අත්කර ගනිමින් අවශ්‍ය සැලසුම් හා ඇස්තමේන්තු පවා පිළියෙල කොට දැනට අවුරුදු කීපයක්ම ගතවී ඇති බව එතුමා දන්නවාද? (ආ) මෙම දිස්පැන්සරියෙන් එම ප්‍රදේශයට විශාල යහපතක් අත්වන බැවින් ඉක්මණින් එය ක්‍රියාත්මක කිරීමට එතුමා කටයුතු කරනවාද? (ඉ) එසේ නම්, කවදාද? නොඑසේ නම්, හේතු කවරේද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) மிகிந்தலைத் தொகுதியிலே, பயிரிமடுவையையும், அதன் சுற்றுடலையும் சேர்ந்த பதினா

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

யிரக்கணக்கான கிராம மக்களின் தேவையைப் பூர்த்திசெய்வதற்காக, பயிரிமடுவையில் ஒரு மருந்தகத்தை நிறுவுவது நல்லதென அனுராதபுர மாவட்ட இணைப்புக்குழு செய்த சிபாரிசின்பேரில், ஐந்து ஏக்கர் காணியை விலைக்கு வாங்கி, அவசியமான படங்கள் வரையப்பட்டு, செலவு மதிப்பிடப்பட்டும் முடியுந்தறுவாயில் பல வருடங்கள் கழிந்துள்ளன என்பதை அறிவாரா? (ஆ) இந்த மருந்தகத்தின் மூலமாக இப்பிரதேசத்துக்கு பெருத்த நன்மையைச் செய்ய முடியுமாகையால், அதனை உடனடியாகச் செய்து முடிக்க அவர் ஆவன செய்வாரா? (இ) ஆமெனில், எப்பொழுது? இல்லையெனில், ஏன்?

asked the Minister of Health: (*a*) Is he aware that several years have elapsed since five acres of land were acquired and the necessary plans and estimates prepared in terms of the recommendation of the District Co-ordinating Committee, Anuradhapura, that a dispensary be set up at Pairimaduwa in the Mihintale Electorate for the benefit of the large number of rural folk who live in and around Pairimaduwa? (*b*) Will he take early action to provide this dispensary as the area concerned will greatly benefit by it? (c) If so, when?

**විමලා කන්නන්ගර මිය.**

*(திருமதி விமலா கன்னங்கர)*

(Mrs. Wimala Kannangara)

(අ) ඔව්. (ආ) පසුගිය දැවුරුදු කාලය තුළ මධ්‍යම බෙහෙත් ශාලා ඉදිකිරීම සඳහා මුදල් වෙන් කර දී නොමැති ය. මුදල් ලබාගත හැකි වූ විට වෙනත් මේ හා සමාන ඉල්ලීම් සමඟ මේ ඉල්ලීම් ගැන සළකා බලනු ඇත. (ඉ) පැන නො නඟී.

වාචික පිළිතුරු

## ලොරි රියැදුරන් හා ක්ලීනර්වරුන් සඳහා පඩිපාලක සභාවක්

### லொறிச்சாரதிகளுக்கும் கிளினர்களுக்கும் சம்பளச் சபை

### WAGES BOARD FOR LORRY DRIVERS AND CLEANERS

11. ද සොයිසා සිරිවර්ධන මයා. (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.—වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. பீ. எம். கே. தென்னக்கூன் சார்பாக)*

(Mr. de Zoysa Siriwardena on behalf of Mr. P. M. K. Tennekoon)

කම්කරු හා රැකීරක්ෂා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දිවයිනේ පුද්ගලික ලොරි හිමියන් යටතේ සේවය කරන ලොරි රියැදුරන් හා ක්ලීනර්වරුන් දසදහස් ගණනක් ලොරි හිමියන්ගේ ග්‍රහණයට අසුව පීඩා විඳින බැව් එතුමා දන්නවාද? (ආ) ඒ පිරිස සඳහා පඩිපාලක සභාවක් ඇතිකොට ඔවුනට ස්ථිර හා සාධාරණ වැටුප් ක්‍රමයක් ඇති කිරීමට එතුමා කටයුතු කරනවාද? (ඉ) එසේ නම්, කවදාද? නොඑසේ නම්, හේතු කවරේද?

தொழில், தொழில் வசதி அமைச்சரைக் கேட்ட வினா: (அ) தீவிலுள்ள தனிப்பட்ட லொறிச் சொந்தக்காரரிடம் சேவைபுரியும் பதினாயிரக் கணக்கான லொறிச்சாரதிகளும், கிளினர்களும் லொறிச் சொந்தக்காரர்களின் பிடியிலகப்பட்டு கஷ்டப்படுகின்றனரென்பதை அவர் அறிவாரா? (ஆ) அவர்களுக்கென ஒரு சம்பளச் சபையை நிறுவி அவர்களுக்கு நிரந்தரமானதும், நியாயமானதுமான ஒரு சம்பள விகிதத்தை ஏற்படுத்த அவர் ஆவன செய்வாரா? (இ) ஆமெனில், எப்பொழுது? இல்லையெனில், காரணம் யாது?

asked the Minister of Labour and Employment: (*a*) Is he aware that the lorry drivers and cleaners employed by the various private lorry owners in the country are being exploited by their employers? (*b*) Will he take action to set up a wages board for these persons and also take action to provide for a fixed and fair salary scale for them? (c) If so, when? If not, why?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

(අ) නැත. (ආ) මේ පිරිස සඳහා දැනට මත් පඩිපාලන සභාවක් පිහිටුවා ඇති අතර, අවම වැටුප් ද නියමකර ඇත. (ඉ) ඉහත (ආ) අනුව පැන නොනගී.

### වතු සමාගම් සතු දිය උල්පත් රක්ෂණය කිරීම සඳහා පනතක්

தோட்டக் கம்பெனிகளின் நீரூற்றுக்களைப் பாதுகாப்பதற்கான மசோதா

**BILL FOR PROTECTION OF WATER SPRINGS OF ESTATE COMPANIES**

12. **ද සොයිසා සිරිවර්ධන මයා.** (කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.—සොරනාතොට—වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொரணத் தோட்டை—சார்பாக)*

(Mr. de Zoysa Siriwardena on behalf of Mr. K. Y. M. Wijeratne Banda—Soranatota)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 29.1.69 වැනි දින බදුල්ලේ දිසාපති කාර්යාලයේදී පැවැත්වූ දිස්ත්‍රික් කෘෂිකර්ම රැස්වීමේදී වතු සමාගම්වලට අයත්ව ඇති දිය උල්පත් රක්ෂණය කිරීම සඳහා පනතක් ගෙනෙන බව ප්‍රකාශ කරන ලද්දේද? (ආ) එසේ නම් එකී පනත නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කරන ලද්දේද? (ඉ) නොඑසේ නම් ඒ මන්ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) 29.1.69 ஆம் தேதியன்று பதுளை அரசாங்க அதிபர் அலுவலகத்தில் நடைபெற்ற மாவட்ட விவசாய கூட்டத்தில் தோட்டக் கம்பெனிகளுக்குச் சொந்தமான நீரூற்றுக்களைப் பாதுகாப்பதற்காக ஒரு சட்டம் இயற்றப்படுமென கூறப்பட்டதா? (ஆ) ஆமெனில், மேற்கூறிய சட்டமூலம் பிரதிநிதிகள் சபையில் சமர்ப்பிக்கப்பட்டதா? (இ) இல்லையெனில், ஏன்?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Was it stated at the district agricultural committee meeting held on 29.1.69 at the G.A's Office, Badulla, that a Bill will be introduced for the protection of water springs that belong to estate companies? (*b*) If so, was the Bill referred to introduced in the House of Representatives? (*c*) If not, why?

**විමලසේන මයා.**

*(திரு. விமலசேன)*

(Mr. Wimalasena)

ගරු ඉඩම් වාරිමාර්ග හා විදුලි බල පිළිබඳ ඇමතිතුමා වෙනුවෙන් පහත සඳහන් පිළිතුර සපයනවා.

(අ) ඔව්. (ආ) නැත. (ඉ) කෙටුම්පත් පනත දැනට පිළියෙල වෙමින් පවතී.

## කෙටුම්පත් පණත් පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்

### BILLS PRESENTED

**තේ ප්‍රචාරක (සංශෝධන) පනත් කෙටුම්පත**

தேயிலைப் பிரசார (திருத்த) மசோதா

**TEA PROPAGANDA (AMENDMENT) BILL**

"to amend the Tea Propaganda Ordinance".

පිළිගන්වන ලද්දේ ගරු හියු ප්‍රනාන්දු, වාණිජ හා වෙළඳ ඇමති විසිනි. 1969 මැයි මස 5 වන සඳුදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

வர்த்தக, வியாபார அமைச்சர் கௌரவ ஹியூ பெர்ணண்டோ அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1969 மே 5, திங்கட்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்படவேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. Hugh Fernando, Minister of Commerce and Trade; to be read a Second time upon Monday, 5th May 1969, and to be printed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## දෙරබේරුව ආදි ස්ථානවලට ආණ්ඩුවේ බෙහෙත්ශාලා

தொரபேருவ முதலிய இடங்களில் அரசாங்க மருந்தகங்கள் திறவுதல்

## Establishment of Government Dispensaries at Doraberuwa, Etc.

**එස්. බී. හේරත් මයා.** (හිරියාල)
*(திரு. எஸ். பி. ஹேரத்—ஹிரியால)*
(Mr. S. B. Herat—Hiriyala)
I move,

> "That in view of the absence of a hospital and transport facilities in Doraberuwa, Dagama, Seeradunna, Hunupola and Diddeniya, this House is of opinion that government dispensaries should be established in these areas."

I wish to explain this Motion. In Hiriyala most of the roads are in a bad condition and the villages are far apart. In the absence of a hospital in this area it is essential that government dispensaries should be established very early.

On the last occasion on which I introduced certain Motions calling upon the Government to supply various requirements of these areas, the Opposition countered by saying that I was introducing those Motions because it was the final year of our term of office. I should like to tell the Opposition that my Motions related to the needs of my electorate, and that during the past four years we have attended to many of the needs of the people of my electorate. Many of these matters had been hanging fire for the last ten years. The previous regimes had neglected these requirements. I am trying to see that even at this late stage these requirements are supplied.

The last Government had no money to be expended on these items. When we came to power in 1965 we started work on many items, such as the establishment of dispensaries. Dispensaries which were almost collapsing were repaired, hospitals that had no drugs were given drugs, thanks to the Hon. Minister of Health. Today there



is a hospital in my area where the daily O. P. D. attendance is about six to seven hundred patients whereas in the past not more than a hundred patients were treated for want of drugs. I refer to the Government Hospital at Hiripitiya. In spite of the high O. P. D. attendance the patients are treated well and regularly.

The dispensaries for the setting up of which I have introduced this Motion may be established this year or the next year or the year after. We have to make a start somewhere. Unless we make a start this year or the next year we shall never be able to get these things done. During the first two years of our Government we had to clean the debris left by the previous Government, and it was only during the last two years that we were able to rectify most of the shortcomings. We are now well away and able to get our requirements.

In asking the Hon. Minister for these dispensaries at Doraberuwa, Dagama, Seeradunna, Hunupola and Diddeniya, I would say that these are important and densely populated villages where dispensaries should be opened as soon as possible, and I would thank the Hon. Minister to take very early action.

අ. භා. 2.17

**එම්. ඒ. ඩැනියෙල් මයා.** (හේවාහැට)
*(திரு. எம். ஏ. டனியல்—ஹேவாஹெற்ற)*
(Mr. M. A. Daniel—Hewaheta)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිරියාල ගරු මන්ත්‍රීතුමා (එස්. බී. හේරත් මයා.) විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරන අතර මේ ඉදි කිරීමට බලාපොරොත්තු වන ආරෝග්‍යශාලාවලට අවශ්‍ය බෙහෙත්, ප්‍රමාණය වරින් වර ලැබී තිබෙන බවත් මා මතක් කරන්න කැමතියි. ඒ ගැන අපි මේ රජයට ස්තුතිවන්ත විය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බලාපොරොත්තු වන මෙම වාහන පහසුකම් සම්බන්ධයෙන් රජයට කරුණු ඉදිරිපත් කර ඇතත් තවමත් එම පහසුකම් ලැබී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩැනියෙල් මයා.]

නැති නිසා, හිරියාල ගරු මන්ත්‍රීතුමා බලා පොරොත්තු වන්නේ එම ප්‍රදේශවල බෙහෙත් ශාලා ශාඛා වශයෙන් පිහිටු වීමෙන් එම පළාත්වාසීන්ට සේවයක් කිරීමටයි.

මේ අනුව කල්පනා කර බලන විට මා මතක් කරන්න කැමතියි, ලංකාවේ අස්සක් මුල්ලක් නෑරම දැනට උණ රෝගයක් පැතිරී තිබෙන බව. එම උණ රෝගයට ප්‍රතිකාර ලබා දීමට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මහත් උත්සාහයක් දරනවා. සෑම ප්‍රදේශයකම සිටින ජනතාවට සෑම අංශයකින්ම අවශ්‍ය ප්‍රතිකාර ලබා දීමට වුවමනා කටයුතු සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පිළියෙල කර දී තිබෙන බව මතක් කරන්න කැමතියි. ඒ අනුව අද සමහර ආරෝග්‍ය ශාලාවල—පාර්ලිමේන්තුවේදී මොකක් දෝ නමකින් මේ රෝගය හඳුන්වන්න යෙදුනා—මෙම රෝගය බොහෝ දුරට අඩු වෙමින් යන බවකුත් පෙනෙනවා. දවස් ගණනාවක් තිස්සේම පැවති මෙම උණ රෝගය පෙරෙයිදායින් පසු බොහෝ දුරටම අඩු වී ගොස් තිබෙන බවක් පෙනෙනවා. ඒ නිසා නව දවස් දෙක තුනකින්ම එම රෝගය—මෙම ගරු සභාවේදීත් ප්‍රකාශ කළ හැකි වන පරිදි—එම වසංගත රෝගය ඉතා ඉක්මනින්ම මෙම රටින් ඈත් වී යන බව මා ප්‍රකාශ කරන්න කැමතියි.

සමහර ප්‍රදේශවල ආරෝග්‍යශාලාවලට අවශ්‍ය බෙහෙත් ප්‍රමාණය නොලැබී යනවා විය හැකියි. නමුත් එම දෙපාර්තමේන්තු නිලධාරීන් උනන්දුවෙන් ඒ සම්බන්ධ කටයුතු කරනවා නම් ඒ අවශ්‍ය බෙහෙත් ප්‍රමාණය ලබා ගත හැකි වන බව ප්‍රකාශ කරමින් හිරියාල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ද ස්ථිර කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

අ. භා. 2.20

**ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදුව)

(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ)

(Mr. Prins Gunasekera—Habaraduwa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිරියාල ගරු මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද යෝජනාවට—එතුමාගේ පළාතේ වැඩි දෙනාට නොතේරෙන භාෂාවෙන් ගෙන එන ලද යෝජනාවට—මගේ අනුමැතිය දක්වීමටයි මා නැඟී සිටියේ.

පසුගිය සතියේ ඒ මන්ත්‍රීතුමා පෞද්ගලික යෝජනාවක් ගෙන ආ අවස්ථාවේදී සමහර ගරු මන්ත්‍රීවරුන් විසින් එතුමාට දොස් කියන්න යෙදුනා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වුණත් අවුරුදු 4කට පසුව මෙවැනි යෝජනා මන්ත්‍රී මණ්ඩලයට ගෙන එන ලද්දේ ඇඟ බේරා ගන්නටය කියා. මෙවැනි යෝජනා ගෙන ආ බවට වාර්තා ගත වීමෙන්—ඒවා හැන්සාඩ් වාර්තාවේ පළ වීමෙන්—තමන්ගේ ඇඟ බේරා ගැනීමට උත්සාහ දරන බවක් කියමින් එතුමාව විවේචනය කරන්න යෙදුනා. සමහර විට හිරියාල ගරු මන්ත්‍රීතුමා එම විවේචනය නිසා විය හැකියි, අද තමන්ගේ ඡන්දදායකයින්ට නොතේරෙන භාෂාවකින් මෙම යෝජනාව ඉදිරිපත් කළේ. දැන්, එම පළාතේ ඡන්දදායකයින්ට දැනගැනීමට වුවමනා නිසා මෙවැනි යෝජනාවක් ගෙන ආවාය කියන්න පුළුවන්කමක් නැහැ. එම රෝගය සෑදී අසනීපයෙන් සිටින සිංහල ඡන්දදායකයින්ට තේරෙන්නේ නැහැ, එතුමා මොනවා කිව්වාද කියා. සමහර විට මේ රෝගය සෑදී තිබෙනවා නම් සෑදී තිබෙන්නේ ඉංග්‍රීසි කතා කරන අයට පමණක් වෙන්නත් පුළුවනි. කෙසේ වුණත් ගිය සතියේදී විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද තර්ක නිසා එතුමාට සිංහල මතක නැති වී අද ඉංග්‍රීසියෙන් මෙම යෝජනාව ඉදිරිපත් කරන්න යෙදුනා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මතු කරන ප්‍රශ්නය මෙයයි.

අද න්‍යාය පත්‍රයේ අඩංගු පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනාවලින් මුල් යෝජනා නවයම තිබෙන්නේ හිරියාලේ ගරු මන්ත්‍රීතුමාගේ නමිනුයි. එතුමා ආණ්ඩු පක්ෂයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රීවරයෙක්. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරයකු තමාගේ යෝජනා න්‍යාය පත්‍රයේ මුලටම දමා ගැනීම ගැන නොවෙයි මා පැමිණිලි කර සිටින්නේ. අද දින න්‍යාය පත්‍රයටම ඇතුළත් වෙලා තිබෙනවා අවුරුදු එක හමාරක් දෙකක් පැරණි යෝජනා. මා නමින් තිබෙන, මරණීය දණ්ඩනය අහෝසි කිරීම පිළිබඳ යෝජනාව අවුරුදු එකහමාරක් පමණ පැරණි එකක්. චෙකෝස් ලෝවේකියාව ආක්‍රමණය කිරීම පිළිබඳ යෝජනාවත් පැරණි එකක්. 1968දී ප්‍රංශයේ ඇති වූ විප්ලවය හා සම්බන්ධ යෝජනාවත් පැරණියි. ඒ වාගේ පැරණි යෝජනා තිබියදී අලුතින් ඉදිරිපත් කරනු ලබන යෝජනා න්‍යාය පත්‍රයේ මුලට වැටෙන්නේ කොහොමදැයි දැනගන්නට මා කැමතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

When you give notice of a Motion you mention a date and the Motion appears on the Order Paper for that date. Motions for which no date has been asked appear after that. That is how some of the Motions given earlier are down in the list.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
**(Mr. Prins Gunasekera)**

එහෙත් මා දනට අවුරුදු එකහමාරකට පමණ පෙර කල් දුන් යෝජනාව සඳහා දිනයක් නියම කර තිබුණත් එදාට ඒ යෝජනාව විවාදයට භාජන කරන්නට නොලැබුණේ තවත් පැය භාගයකින් පමණ අදත් සිදු වන්නට යන විධියටයි; ගණපූරණයක් නැතිකම පිළිබඳ ප්‍රශ්නයක් උඩ පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා විවාද කරන දිනයේදී මේ ගරු සභාවේ රැස්වීම් කල් යන නිසයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The Opposition can make up the Quorum if they so decide.

දෙරබේරුව ආදි ස්ථානවලට ආණ්ඩුවේ බෙහෙත්ශාලා

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

විරුද්ධ පාර්ශ්වයේ වගකීමක් නොවෙයි එය.

**ගරු ආර්. ප්‍රේමදාස (පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(கௌரவ ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)*
(The Hon. R. Premadasa—Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information & Broadcasting)

මුළු සභාවේම වගකීමයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඒ කොයි හැටි වෙතත්, සමහර දවස්වල දෙගොල්ලන්ම කථා වෙලා වාගේ තමයි සිද්ධ වන්නේ.

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும்)*
(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs and Minister of Planning & Economic Affairs)

You have already explained who is responsible for the Order Book. We are not responsible for it. The hon. Member should find out what the procedure is.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Why does the hon. Member not wait to speak on his own Motion?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

කවදාවත් කෙරෙන්නේ නැති වැඩක් ඒක. අවුරුදු එක හමාරක් දිගටම එනවා. අද අනුගමනය කෙරෙන ක්‍රියා පටිපාටිය වැනි ක්‍රියා පිළිවෙළකින් සිදු වන්නේ කුමක්ද? ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට තමන්ගේ කණ්ඩායමේ රැස්වීමකදී වුවත්, ගරු ඇමතිවරයකු ඉදිරියේදී වුවත් කරුණු ඉදිරිපත් කර බොහොම පහසුවෙන් තමන්ගේ ප්‍රශ්න නිරාකරණය කර ගන්නට පුළුවන්කම තිබෙන නමුත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකුට එවැනි අවස්ථාවක් නැහැ. මහජන මන්ත්‍රී මණ්ඩලයේදී පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා දිනයකදී කරුණු ඉදිරිපත් කරන්නට ලැබෙන අවස්ථාව පවා ඒ අයට නොලැබී යෑමයි සිදු වන්නේ. ඒ ගැනයි මා විරුද්ධත්වය දක්වන්නේ. ඔබතුමා දන්නවා ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරයකුට වුවත් පෞද්ගලික මන්ත්‍රීවරයකු හැටියට යෝජනා ඉදිරිපත් කරන්නට අයිතියක් තිබෙන බව. එහෙත් පෞද්ගලික මන්ත්‍රීවරුන්ට අපේ ස්ථාවර නියෝගවලින් ඉඩ කඩ ලැබී තිබෙන්නේ වැඩිපුරම විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන්ගේ අඩුපාඩු ගැන මහජන මන්ත්‍රී මණ්ඩලයේදී කරුණු ඉදිරිපත් කිරීමටයි. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ගරු අගමැතිතුමා හෝ වෙනත් ඇමතිවරයකු හෝ හම්බ වීමට අවස්ථාවක් තිබෙනවා. එහෙත් විරුද්ධ පාර්ශ්වයේ අයට එහෙම අවස්ථාවක් නැහැ. ගරු ඉඩම් ඇමතිතුමා හමු වන්නට මට වුවමනා කෙළේ මගේ ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න දෙකක් ගැන කියන්නටයි. එහෙත් ඒ සඳහා දිනයක් ලබා ගන්නට බැරි වුණා. ගම් පුළුල් කිරීම යටතේ ඉඩමක් ලබා ගැනීම සම්බන්ධයෙන් කථා කර ගන්නට කවදාවත් අවස්ථාවක් මට ලැබී නැහැ. ටෙලිෆෝනයෙන් ඇමතීමක් ගත්තත් අපට ගරු ඇමතිතුමා සමග කථා කරන්නට පුළුවන් කමක් නැහැ. එක්කෝ අද එන්නේ නැහැ කියනවා; එහෙම නැත්නම් ඇත් ඉදලා ගියා කියනවා. මොනවා හරි හේතුවක් කියනවා. කොයි හැටි වෙනත් ගරු ඇමතිතුමා හමු වී අපේ ප්‍රශ්න ගැන කථා කරන්නට අවස්ථාවක් ලබා ගැනීම බොහොම දුෂ්කරයි. පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ඉදිරිපත් කිරීමට තිබෙන අයිතිය පිළිබඳ ප්‍රතිපත්තිය සාර්ථක ලෙස ක්‍රියාත්මක නොවීම ගැනයි මා ඔබතුමාට මේ කරුණු සඳහන් කෙළේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

If the hon. Member had given a clear date, then his Motions would appear on that date.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

දිනය දීම පිළිබඳව පමණක් නොවෙයි මා සඳහන් කෙළේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

It depends purely on the date that you give. If you give a clear date knowing well in advance according to Standing Orders when the Private Members' Day will be, your Motion will come first. There is no jobbery here in the way of fixing a date for the Motion. Where no dates have been given, motions appear absolutely in the order they were received.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මේ යෝජනාවලට නොම්මර දී තිබෙන්නේ ලැබෙන පිළිවෙළ අනුවයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

What is most important is the date you mention. If you had given notice two months ahead your Motion would have come up first if you wanted it taken up early.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අද සාකච්ඡා කරන යෝජනාව 1968 දී භාර දෙන ලද එකක් බව ඔබතුමාට පෙනෙනවා ඇති. 1968 දී මේ යෝජනාව ඉදිරිපත් කරන විට මෙම යෝජනාව සාකච්ඡා කරන පළමු වන දවස අද හැටිය ට සලකන්නය කිව්වායයි හිතන්න පුළුවන්ද? ඒ කෙසේ වෙතත්, **හැන්සාඩ්** වාර්තාගත වීම සඳහා මා කියනවා, මා නමින් තිබෙන හැම යෝජනාවක්ම මීට පසු පළමුවෙන්ම යෙදෙන පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා දිනයේදී ඉදිරිපත් කරන්නය කියා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The hon. Member for Hiriyala gave today's date and that is how his Motions appear first.

**ඩැනියෙල් මයා.**
*(திரு. டனியல்)*
(Mr. Daniel)

මා එයට විරුද්ධයි. ගරු නියෝජ්‍ය කථානායකතුමා කීවේ පළමුවෙන්ම යෝජනාව ඉදිරිපත් කරන විට ඒවා සාකච්ඡාවට ගත යුතු දිනය සඳහන් කළ යුතු බවයි. එසේ සඳහන් කළා නම් ඒ පිළිවෙළට යෝජනා සභාවට ඉදිරිපත් කරනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

තමුන්නාන්සේ විරුද්ධ වෙලා ඇති වැඩක් නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Already there are six Motions for June 10 in the Order Book. Your Motion will be the seventh if you give that date today.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිරියාලේ ගරු මන්ත්‍රීතුමාගේ (එස්. බී. හේරත් මයා.) යෝජනාවෙන් පැනනගින කරුණු ගැන අපේ කිසිම මතභේදයක් නැහැ. එතුමාගේ පළාතේ මැලේරියා රෝගය පැතිරී තිබෙනවා නම් එය වළක්වා ගැනීමට අප්‍රමාදව පියවර ගන්නවා ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

**ඩැනියෙල් මයා.**
*(திரு. டனியல்)*
(Mr. Daniel)

ඒක මැලේරියා නොවෙයි, මා ඕ ගේ රෝගය.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

තමුන්නාන්සේලා බෝ කරන ඕනෑම ලෙඩක් නැති කර ගැනීමට මේ රටේ කොයි ප්‍රදේශයකට වුනත් වෛද්‍ය පහසුකම් වැඩි පුර සලසනවා නම් ඒ ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. පුළුවන් තරම් ඉක්මනින් මේ ඉල්ලීම ඉටු කරන ලෙස මමත් නිර්දේශ කරනවා.

අ. භා. 3.30

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිරියාලේ ගරු මන්ත්‍රීතුමා ගම් 5 කට ආණ්ඩුවේ බෙහෙත් ශාලා ඉල්ලා සිටිනවා. ආණ්ඩුවේ බෙහෙත් ශාලා පිළිබඳ ප්‍රශ්නය ගැන බලන විට මොන ආණ්ඩුවක් යටතේවත් ඒවායින් සතුටුදායක සේවයක් සැලසෙනවාය කියා සිතන්නට අමාරුයි. ආණ්ඩුවේ බෙහෙත් ශාලාවල තිබෙන්නේ පාට කළ බෙහෙත් වතුර බෝතල ටිකක් පමණයි. හැම ලෙඩේටම දෙන්නේ එක බෝතලෙන්. මා එය හොඳ හැටි දන්නා කාරණයක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

කොයි දිස්පැන්සරියෙන්ද දැනීම ලබා ගත්තෙ ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

ඒ මාතර දෙස්තරවරු.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මාතර පළාතක් නොවෙයි, හැම තැනම. මාතර දෙස්තරවරුන්ට එහෙම නින්දා කරනවට මා විරුද්ධ වෙනවා. ලංකාවේ හැම තැනම ආණ්ඩුවේ බෙහෙත්ශාලාවල සෑහෙන බෙහෙත් හේත් නැති බවයි, මා කියන්නේ. බොහොම ලෙඩුන් බෙහෙත් ශාලාවලට ගියාම ඒ ලෙඩුන්ට ලැබෙන්නේ ලෙඩට අවශ්‍ය බෙහෙත් නොවෙයි. ඒ නිසා ලෙඩ උග්‍ර වෙලා අන්තිමේදී ඒ ලෙඩුන්ට කිට්ටුව තිබෙන ආරෝග්‍යශාලාවට යන්නට සිදු වෙනවා. ඇත්ත වශයෙන්ම සිදු වී තිබෙන්නේ ආණ්ඩුවේ බෙහෙත්ශාලාවල සෑහෙන තරම් බෙහෙත් නැති නිසා ලෙඩුන් තවත් අමාරුවට පත් වීමයි. දවස් ගණනක් තියාගෙන සිට පසුව ලෙඩාව ආරෝග්‍යශාලාවට යැව්වාමු බෙහෙත් කරන්නට බැරි තරමට ලෙඩේ උග්‍ර වී තිබෙන නිසා ලෙඩා මැරී යනවා. ආණ්ඩුවේ බෙහෙත් ශාලා, අවශ්‍ය බෙහෙත් ආදිය ඇතිව අංග සම්පූර්ණව සකස් කරනවා නම් එයින් ගම්වල ජනතාවට සෑහෙන සේවයක් ලබා ගන්නට පුළුවනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවේ බෙහෙත් ශාලාවලින් බෙහෙත් දෙනු ලබන්නේ නොමිලේ වුවත් බොහෝවිට දෙස්තර මහතාට මුදලක් නොදී බෙහෙත් ටික ලබා ගැනීමට ගම්බද දුප්පත් ජනතාවට බැරි වී තිබෙනවා. ආණ්ඩුවේ බෙහෙත් ශාලාවලින් මුදල් නොගෙවා බෙහෙත් ගන්නට පුළුවන්ද කියා තමුන්නාන්සේලා ගම්බද ප්‍රදේශයකට ගොස් සොයා බැලුවොත් ගම්වැසියන් ගෙන් සියයට 90 ක්ම කියාවි මුදල් නැතිව බෙහෙත් ගන්නට බැරිය කියා.

**ඩැනියෙල් මයා.**
*(திரு. டனியல்)*
(Mr. Daniel)

ගරු මන්ත්‍රීතුමා මේ කථා කරන්නේ බෙහෙත් ප්‍රශ්නයක් ගැන නොවෙයි මුදල් ප්‍රශ්නයක් ගැනයි. බෙහෙත් නැත්නම් මුදල්වලට දෙන්නේ කොහොමද ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

බෙහෙත් නැත්තේම නැහැ. එහෙත් අංගසම්පූර්ණ නැහැ. වුවමනා බෙහෙත නැහැ. ඒ තිබෙන බෙහෙත් ටිකත් ගන්නට ගියාම් මුදලක් නොදුන්නොත් ලැබෙන්නේ නැහැ.

**විමලා කන්නන්ගර මිය.**
*(திருமதி விமலா கன்னங்கர)*
(Mrs. Wimala Kannangara)

පැමිණිල්ලක් ඉදිරිපත් කළොත් පරීක්ෂා කරන්නම්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මා කියන්නේ පොදුවේ. ආණ්ඩුවේ දිස්පැන්සරිවලට දෙස්තරවරුන් බොහොම සුළුවට ඇවිත් එතනින් යන්නේ විශාල බැංකු එකවුන්ට් එකකුත් ඇතිවයි. පටන් ගන්නේ සුළුවෙන් ; යන්නේ ලොකුවට.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

හැම දෙස්තර කෙනෙක්ම පටන් ගන්නේ සුළුවෙන්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ආණ්ඩුවේ දිස්පැන්සරියක දොස්තර කෙනෙක් සුළුවෙන් පටන්ගෙන ධනපති යෙක් වී එළියට එනවා නම් තමුන්නාන්සේලා එයට එකගද? (බාධාකිරීමක්) දොස්තරවරුන් පෞද්ගලිකව කරන සේවය නවත්වා කෙලින්ම ආණ්ඩුවෙන් බෙහෙත් දෙන පිළිවෙළක් ඇති කරන්නට තමුන්නාන්සේලා ලෑස්ති නම් අපිත් එයට එකගයි.

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) ආණ්ඩුවේ සේවකයෙක් වෙන්න කැමති වෙයිද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

එතුමා ආණ්ඩුවේ සේවකයෙක් වෙනවාද නැද්ද කියන එක වෙනම ප්‍රශ්නයක්. එවැනි වැඩ පිළිවෙළක් ඇති කළොත් එතුමා එයට සම්පූර්ණයෙන්ම එකග වේවි.

**ඩැනියෙල් මයා.**
*(திரு. டனியல்)*
(Mr. Daniel)

ඔය බෙහෙත් ජාවාරමට තමුන්නාන්සේත් සම්බන්ධයි නේද? "තුඩාවේ බ්‍රදර්ස්" කියා බෙහෙත් ශාලා ගාල්ල, මාතර, කොළඹ ආදී නොයෙකුත් පළාත්වල තිබෙනවා මා දැක තිබෙනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

තමුන්නාන්සේ කොහේ ඉඳල ආවද කියල මම දන්නේ නැහැ. පැමිණි වේලාවේ ඉඳලම මෙතන උඩ පනිනවා. (බාධාකිරීමක්) මොනවා කියනවාද මා දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නය මෙයයි: පුංචියට පටන් ගෙන හුඟක් විශාල වෙනවාය, දොස්තර මහත්වරු වැඩිපුර ආදායම් ලබා ගන්නවාය කියා ගරු අගමැතිතුමා කීවා. එහෙත් අගමැතිතුමා කීවේ පෞද්ගලික දොස්තර මහත්වරුන් ගැනයි. ඒක ඇත්ත තමයි. එහෙත් මා කියන්නේ ආණ්ඩුවේ දිස්පැන්සරිවල සිටින දොස්තර මහත්වරුන් ගැනයි. ආණ්ඩුවේ දොස්තර කෙනෙක් ගම්බද ප්‍රදේශවල දුප්පත් මහජනතාව සූරාගෙන කනවා නම් ගරු අගමැතිතුමා එයට එකග වෙනවාද? ඒ අය ආණ්ඩුවේ බෙහෙත් ටික විකුණා ගෙන තර වෙනවා නම් එයට එකගද? ඒ ගැන කියන විට ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක් දඟලනවා.

**ඩැනියෙල් මයා.**
*(திரு. டனியல்)*
(Mr. Daniel)

ඇයි නැවැත්තුවෙ නැත්තේ? (බාධාකිරීමක්).

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ආණ්ඩුවට මේවා නවත් වන්නට බැරි නම් අපටද පුළුවන්?

**ඩැනියෙල් මයා.**
*(திரு. டனியல்)*
(Mr. Daniel)

ගරු මන්ත්‍රීතුමාට පුළුවන්ද නවත්වන්නට?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

කොහේ ඉඳලා ආවාද මා දන්නේ නැහැ. ඒ පළාතේ මහජනතාවටත් තමුන්නාන්සේ ලජ්ජාවක්. ආණ්ඩුවේ බෙහෙත් ශාලාවල තිබෙන දූෂණ නවත්වන්නට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු අපටයි කියන්නේ. රජයෙන් නොමිලේ දෙන බෙහෙත් ටික මුදල් දීලා ගන්නට සිදු වී තිබෙන තත්ත්වය නවත් වන්නට අපටයි කියන්නේ. මේක පුදුම වැඩක්නෙ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ඉල්ලීම නම් මේ රටේ දුප්පත් මුදල් නැති මහජනයා වෙනුවෙන් පිහිටුවා තිබෙන ආණ්ඩුවේ බෙහෙත්ශාලාවලින් ඔවුන්ට


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

මුදල් නොගෙවා බෙහෙත් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන්ට කියන එකයි. මේවා පිහිටුවා තිබෙන්නේ දුප්පත් මහ ජනයාට නොමිලයේ බෙහෙත් දීමට වුණත් අද මුදල් නොදී බෙහෙත් ලබා ගන්නට විධියක් නැහැ. ඒ ආණ්ඩුවේ බෙහෙත් ශාලාවලට ලැබෙන ඉතා වටිනා බෙහෙත් ද්‍රව්‍ය කිහිපයක් තිබෙනවා නම්, ඒවා ලබා ගැනීම සඳහා වැඩිපුර මුදලක් දෙන්නට සිදු වී තිබෙනවා. එතෙක් ඒවා දමා තිබෙන පෙට්ටියෙන් හෝ අල්මාරියෙන් හෙළවෙන්නෙ නැහැ. මුදල් දුන්නොත් පමණයි ඒවා එළියට එන්නේ. මම මේ කාරුණු කියන්නේ දොස්තරවරුන් කෙරෙහි තිබෙන ඊර්ෂ්‍යාවකින් නොවෙයි: දුප්පත් මහජනයාගෙන් අපට මේ විධියේ පැමිණිලි ලැබෙන නිසයි. අපට මහජනයා ගෙන් නිතර නිතර මේ විධියේ පැමිණිලි ලැබෙනවා . මුදල් නැතිව ගම්බද රජයේ බෙහෙත්ශාලාවලින් බෙහෙත් ලබා ගන්නට බැරිය, හොඳ බෙහෙත් ලබා ගැනීමට රුපියල් 5ක් හෝ 10 ක් ගෙවන්නට සිදු වෙනවාය, ආදි වශයෙන් පැමිණිලි ලැබෙනවා. මේ බෙහෙත්ශාලාවලට පත් කරන්නේ සැහෙන සුදුසුකමක්වත් නැති ඇපෝතිකරිවරුයි. ඒ උදවියටත් සල්ලි නොදී ආණ්ඩුවේ බෙහෙත් ලබා ගන්නට බැරි තත්ත්වයකුයි අද මේ රටේ තිබෙන්නේ. අපි ඉල්ලා සිටින්නේ මේ තත්ත්වය නැති කරන්න කියායි. ආණ්ඩුවේ මුදල් යොදවා දිස්පැන්සරි පිහිටුවා තිබෙන්නේ දුප්පත් මහජනයාට නොමිළයේ බෙහෙත් ලබා දීමටයි. එහෙම නම් ඇයි තව වරක් බෙහෙත්වලට සල්ලි ගන්නට ඔවුන්ට ඉඩ දී තිබෙන්නේ ? අපේ විරුද්ධත්වය ඒකයි. අපේ දුක්ගැනවිල්ල ඒකයි. මේක අසාධාරණ තත්ත්වයක්. දුප්පත් මහජනයාට නොමිළයේ බෙහෙත් ලබා ගැනීමට අවස්ථාව තිබෙන්න ඕනෑ. අද එහෙම අවස්ථාවක් නැහැ. මේ තත්ත්වය මේ රටේ දිගටම පැවතගෙන එන තත්ත්වයක් නිසා මම ඒ ගැන මේ ආණ්ඩුවට දොස් කියන්නේ නැහැ. ගරු සෞඛ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේ මෙහි නැහැ. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමිය නම් සිටිනවා. මේ අපි කියන කාරුණු ඇත්තද, නැද්ද කියා ටිකක් සොයා බලන ලෙස මා එතුමියගෙන් ඉල්ලා සිටිනවා. මම කියන්නේ සම්පූර්ණ ඇත්තයි. ආණ්ඩුවේ බෙහෙත්ශාලාවලින් බෙහෙත් ලබා ගැනීමට යන මිනිසුන් බෝතලයත් සමඟ මුදල් ගෙන යන්නේ නැද්දයි කෙනෙකු යවා පරීක්ෂා කර බලන ලෙස මා ඉල්ලා සිටිනවා. දොස්තර මහත්මයාගේ මේසය උඩ සල්ලි ටික තියල තමයි බෙහෙත් බෝතලය ගන්නේ. එවැනි දූෂණවලට ඉඩ තැබීමට කිසිම යුතුකමක් නැහැ.

අනික් තැන්වලත් දූෂණ නැතිවා නොවෙයි. විශේෂයෙන් මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව දූෂණ වැඩි වී තිබෙනවා. ලොරි බලපත්‍ර, කාර් බලපත්‍ර, [බාධාකිරීමක්] ලබා ගැනීමට යාමේදී නොයෙකුත් දූෂණ සිදු වී තිබෙනවා. මේ තත්ත්වයත් වැඩිවී තිබෙනවා මිස අඩු වී තිබෙනවා යයි කියන්නට පුළුවන්කමක් නැහැ. ආණ්ඩුවේ බෙහෙත් ශාලාවලට හරිහැටි බේත් හේත් සපයන්නේ නැත්නම්, ඒ වාගේම මහජනයාට මුදල් නොගෙවා බෙහෙත් ලබා ගැනීමට බැරි නම් මේවා තිබීමෙන් වැඩක් නැහැ. ඒ නිසා මෙම බෙහෙත්ශාලා අංග සම්පූර්ණ බෙහෙත්ශාලා බවට පත් කිරීමට ඒවායේ පවතින දූෂණ නැති කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

තවත් එක ප්‍රශ්නයක් මතු කරන්නට කැමතියි. මගේ කොට්ඨාශයේ මාතර ආරෝග්‍යශාලාවේ ලෙඩුන්ට සැහෙන තරම් ඉඩ කඩ ඇත්තෙ නැහැ. එය පළමුවෙනි පන්තියේ ආරෝග්‍යශාලාවක් වුණත් සැහෙන තරම් ඉඩකඩ නැති නිසා අද අලුත් ආරෝග්‍යශාලා ගොඩනැගිල්ලක් එහි ඉදි වෙමින් පවතිනවා. පසුගිය ආණ්ඩුව මුල්ගල් තැබීමෙන් ආරම්භ කළ ඒ ආරෝග්‍යශාලාව තැනීමේ කටයුතු අවුරුදු 4½ ක් ගතවීත් තවම සම්පූර්ණ කරන්නට මේ ආණ්ඩුවට පුළුවන් වුණේ නැහැ. මාතර නගරයේ ඊට වඩා විශාල තට්ටු ගොඩනැගිලි පෞද්ගලික ව්‍යාපාරිකයන් විසින් ඊට පසුව ඉදි කර තිබෙනවා. ඒ ගැන ඊර්ෂ්‍යාවෙන් කථා කරනවා නොවෙයි. මම කියන්නේ මේ අවශ්‍යතාව අවුරුදු 4½ ක් ගත වන තුරුත් සම්පූර්ණ කරන්නට ආණ්ඩුවට බැරි වුණු බවයි. ලෙඩුන් සිටින්නේ අමාරුවෙන්. මේ නිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මඩිහ-ගොඩගම ගම්කාර්ය සභාව මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික්ක සම්බන්ධතා කාරකසභාවට ඉල්ලීමක් ඉදිරිපත් කර එහි පිටපතක් අමාත්‍යාංශයටත් යවා තිබෙනවා. ඩිස්පෙන්සරිය සඳහා ගොඩනැගිල්ලක් හා අවශ්‍ය අනෙකුත් උපකරණ දෙන්න ගම් සභාව ලෑස්තියි. එම නිසා කරුණාකර ඩිස්පෙන්සරියක් දෙන්න. විශාල ගම්මාන ගණනාවකම ඉන්නා දුප්පත් මිනිසුන්ට දැන් සිදු වී තිබෙනවා, ආරෝග්‍යශාලාවට ගොස් පැය ගණන් පෝලිමේ ඉන්න. එය නවත්වා ඒ දුප්පත් මිනිසුන්ට සහනයක් ලබා දෙන්න නම් මේ ඩිස්පෙන්සරිය ලබා දෙන්න. රජයට තිබෙන්නේ අවශ්‍ය බෙහෙත් හා දොස්තර වරයකු යැවීම පමණයි. හිරියාල ඡන්ද දායක කොට්ඨාශයට ඩිස්පෙන්සරි ලබා දීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවෙන් පවා සම්මත වී අමාත්‍යාංශයට එවූ යෝජනාවක් ක්‍රියාත්මක නොවීම ගැනයි, මං දොස් කියන්නේ. මෙවැනි යෝජනා ඉදිරිපත් වුණත් නැතත්, ගම්බද ප්‍රදේශවල වාසය කරන දුප්පත් මහජනතාවට පහසු වෙන් බෙහෙත් ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුයි. ඒ සඳහා අළුතින් ඩිස්පෙන්සරි ඇති කරන අතරම, තිබෙන ආරෝග්‍යශාලාත් දියුණු කළ යුතුයි. ඒ අතරම පෞද්ගලික ජාවාරම නැවැත්විය යුතුයි.

රජය මහජන මුදල් වියදම් කොට දොස්තරවරුන් පුහුණු කරවනවා. මෙසේ පෞද්ගලික ව්‍යාපාර පවත්වාගෙන යාමට දොස්තරවරුන්ට ඉඩ දී තිබෙන නිසා, රජයේ ආරෝග්‍යශාලාවල සේවය සඳහා හොඳ දොස්තරවරුන් ලබා ගැනීම අපහසු වී තිබෙනවා. එසේම, විභාගයෙන් සමත් වන සියලුම දොස්තරවරුන් රජයේ ආරෝග්‍යශාලාවල සේවය සඳහා යොදා ගන්නටත් රජයට පුළුවන්කමක් නැතිලු. මේ තත්ත්වය නිසා අද රජයේ ආරෝග්‍ය ශාලාවල දොස්තර හිඟයක් පවතිනවා. ඩිස්පෙන්සරිවලට යවන්නේත් දොස්තර වරුන් නොව ඇපෝතිකරිවරුනුයි. රජයේ ප්‍රතිපත්තිය මේකද ?

මේ තත්ත්වය යටතේ, රජයේ ආරෝග්‍ය ශාලාවල සේවය කරන දොස්තරවරුන් ගෙන් ලෙඩුන්ට ප්‍රමාණවත් සේවයක් සැලසෙන්නේ නැහැ. නියම විධියට ලෙඩුන් පරීක්ෂා කරන්නට ඔවුන්ට වේලාවක් නැහැ. ලෙඩාගේ නම, ගම, වයස හා අසනීපය ඇසූ විගසම බෙහෙත් ලියනවා. අඩු තරමින් දොස්තර නළෑවවත් පපුවට තබා පරීක්ෂා කරන්නට තරම් කාලයක් ඔවුන්ට නැහැ. එය දොස්තරවරුන්ගේ වරදක් නොවෙයි. සෑම ලෙඩකුම හරියාකාරව පරීක්ෂා කරන්නට ගියොත්, ලෙඩුන් සියල්ලන්ටම බෙහෙත් දෙන්න වේලාවක් ඉතිරි වන්නේ නැහැ. එම නිසා ඔවුන්ට සිදු වෙනවා, ඉතා කෙටියෙන් බෙහෙත් නියම කරන්න. අප පුරසාරම් දොඩනා වෛද්‍ය ක්‍රමය මේකද ? අගමැතිතුමා සෝවියට් රුසියාවට ගියාම එහි වෛද්‍ය සේවය ගැන කරුණු දනගෙන එන්න.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
නොමිළයේ ප්‍රතිකාර කරනවාද ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒ රටේ පෞද්ගලික ජාවාරම් නැහැ. සියලුම බෙහෙත් නොමිළයේ දෙනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
බලාගෙන එන්නම්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
බලාගෙන ආවාට මදි. එය මේ රටේත් ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ඩිස්පෙන්සරි ඇති කිරීම ගැන අපේ එකඟත්වය පළ කරනවා. එහෙත් ඒවාට දොස්තරවරුන් හා බෙහෙතුත් ප්‍රමාණවත් තරම් සපයන්නට ඕනෑ. ගරු මන්ත්‍රීවරයෙක් කීවා, දැන් ආරෝග්‍යශාලාවල බෙහෙත් ඕනෑ තරම් තිබෙනවාය කියා. එහෙත් පිටගැස්ම සඳහා නියමිත බෙහෙත නැතිව ලෙඩකු මළ බව පත්‍රවල පළ වී තිබුණා. බෙහෙත් නැහැල්ලු. ආණ්ඩුවේ බෙහෙත් ගබඩාවේ බෙහෙත් තිබෙන නොතිබෙන බව හෝ රෝහල්වල බෙහෙත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

තිබෙන නොතිබෙන බව හෝ මා දන්නෙ නැහැ. එසේ නැත් නම් රෝහල්වලින් හරියාකාර යුතුකම් ඉටු නොවන නිසා මෙ වැනි තත්ත්වයක් උද්ගත වී තිබෙනවාද කියාත් මා දන්නෙ නැහැ. සෞඛ්‍ය උප ඇමතිණිය දකින්න ඇති, පිටගැස්මට විදින බෙහෙත නොතිබීම නිසා ලෙඩෙකු මැරුණා යයි පුවත්පත් වල පළ වී තිබුණ බව. එවැනි තත්ත්වයකටයි අප අද මුහුණ පා සිටින්නෙ. ඒ නිසා බෙහෙත්ශාලා සාදනවා වාගේම කරුණාකර ඒවාට අවශ්‍ය බෙහෙත් සහ සුදුසුකම් ඇති දොස්තරවරුනුත් පත් කරන්න. පෞද්ගලික ජාවාරම්වලට යන්නට දොස්තරවරුන්ට ඉඩ දෙන්නෙ නැතුව ඒ දොස්තරවරුන් ඒවාට යොදවා මේවාගේ ඇති දූෂණ නැති කරන්න. ඒකයි අපේ ඉල්ලීම.

අ. භා. 2.48

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)
(Mr. T. B. Tennekoon—Dambulla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවේ බෙහෙත් ශාලාවක් පිහිටුවීම පිළිබඳව ඉදිරිපත් කර ඇති මෙම යෝජනාව ගැන කථා කිරීමට දොස්තර මහතෙකුත් නැඟී සිටි අතරතුරේදී ඊට කලින් වචන දෙක තුනක් කථා කිරීමට මට අවස්ථාව ලැබීම ගැන මා ඉතා ප්‍රීති වෙනවා.

අද දවස ගැන කල්පනා කරන විට මෙය අප කාටත් බෙහෙත් අවශ්‍ය කාලයක් වී තිබෙන බව පෙනෙනවා. කුමන ගෙදරකින් විමසා බැලුවත් ඒ සෑම ගෙයකම ලෙඩුන් තුන් හතර දෙනකු සිටින බව අපට අසන්නට ලැබී තිබෙනවා. අප කාටත් ලෙඩ සෑදුණාම තමයි බෙහෙත් ගැන මතක් වෙන්නෙ. ලෙඩක් වැළඳුණ විටයි යකා සිහි වෙන්නේ යනුවෙන් කථාවක් අපට ඒ කාලෙදි අසන්න ලැබී තිබෙනවා. සතුන්ට බඩගිණි වුණාම ගොදුරු සිහි වෙන්නා වාගේම ලෙඩක් ඇති වුණාමයි යකා සිහි වෙන්නෙ. ඉතින් බෙහෙත් සෙවීමට වඩා යකාට නූලක් බැඳ ගුරුකම් අතේ වැඩ කිරීමයි ඒ කාලෙදී සිදු වුණේ. අන්න ඒ වාගේම වතී ස්ථානයේ ලෙඩදුක්වලට බෙහෙත් ගැනීමට බෙහෙත් ශාලා නොසාගෙන [illegible] පුරුදුව ඇති නිසා විශේෂයෙන් මන්ත්‍රීවරුන් වශයෙන් බෙහෙත් ශාලා ඇති කර දීමේ ආශාවක් අපට තිබෙනවා. ලෙඩක් වැළඳුණ විට බෙහෙත් ශාලාවකට ගොස් ප්‍රතිකාර ලබා ගැනීමට අද අප සෑම දෙනෙකුම පුරුදුව සිටිනවා. මුළු රටම අද බෙහෙත් ශාලාවලින් ප්‍රයෝජන ගන්නවා.

පුරාණයේ නම් නියෝජ්‍ය කථානායකතුමනි, සිංහල වෛද්‍යවරුන් හැටියට සෑම ගමකම සෑම ලෙඩටම ප්‍රතිකාර කිරීමේ දක්ෂතා ඇති වෛද්‍යවරුන් සිටියා. එහෙත් ඒ වෛද්‍ය සේවය දැන් අභාවයට ගොස් තිබෙනවා. අනික් සෑම දෙයක් වාගේම පිට රට බෙහෙත් ක්‍රමයට දැන් අප සියලු දෙනාම පුරුදු වී සිටින නිසායි අර වෛද්‍ය සේවය එසේ අභාවයට පත් වී තිබෙන්නෙ. අනික් අතින් ආයුර්වේදයේ ලියාපදිංචි වී නැත්නම් කොතරම් දක්ෂතා තිබුණත්, කොතරම් අත් දැකීම් තිබුණත් ඒ අයට වෙදකම් කරන්න තහනම්. වෙදකම් කළහොත් දඬුවම් කරන්නය කියා නියම කර තිබෙනවා. ඒ නිසා එවැනි අත් දැකීම් සහ දක්ෂතා ඇති වෛද්‍යවරුන් ලියාපදිංචි කරන ලෙස ඉල්ලා තිබෙනවා. ඒ අවසරය ඔවුන්ට ලැබුණේ නැත්නම් ඔවුන්ගේ සේවය තවදුරටත් ලබා ගැනීමට බැරි වෙනවා ඇති. ඒ අනුව අපට කියන්න පුළුවන් ලංකාවෙ ආයුර්වේද දෙපාර්තමේන්තුවක් තිබුණත් නියම දේශීය වෛද්‍ය ක්‍රමය අනුක්‍රමයෙන් විනාශ මුඛයට පත් වී තිබෙනවාය කියා. නියම දේශීය වෙදකම තිබෙන්නේ ලියාපදිංචි වී ඇති අය අතර හෝ ප්‍රසිද්ධ අය අතර හෝ මුදල් හම්බ කර ගැනීමේ පරමාර්ථය පිට වෙදකම් කරන අය අතර හෝ නොවෙයි. සාමාන්‍ය ගම්බද ජනතාව අතරයි නියම දේශීය වෙදකම තිබෙන්නෙ. එහෙත් අර මා මුලින් සඳහන් කළ කාරණා නිසා ඒ වෙදකම සම්පූර්ණයෙන් තුරන් වී ගෙන යනවා. ඒ නිසා ආණ්ඩුවේ බෙහෙත් ශාලා ඇති කිරීමටයි දැන් සිදු වී තිබෙන්නෙ.

මාතර ගරු මන්ත්‍රීතුමා ස්වකීය කථාවෙදි කිව්වා, ආණ්ඩුවේ බෙහෙත් ශාලාවලින් බෙහෙත් ගැනීමේදී මේසෙ උඩටම මුදල් ලබා ගන්නවාය කියා. මාතර පැත්තේ එසේ වුණත් අපේ පැත්තෙ තත්ත්වය ඊට වඩා වෙනස්. බෙහෙත් ශාලාවේදී හෝ රෝහලේදී බෙහෙත් දෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවස්ථාවේ මුදල් ගන්න සිරිතක් එහෙ නැහැ. සේවය කරන අවස්ථාවේදීම මුදල් ගන්නවායයි කීමේ තේරුමක් නැහැ. එහෙත්, දොස්තර මහත්මයා හෝ ඇපෝතිකරි මහත්මයා හෝ ආණ්ඩුවේ සේවය කළත්, ඉක්මනින් ලෙඩ සුව වන හොඳ බෙහෙත්, සැලකිය යුතු බෙහෙත් ලැබෙන්නේ ඔහුගේ ගෙදරට ගොස් බෙහෙත් ගන්නා අයටය යන විශ්වාසයක් අද මිනිසුන් තුළ පවතිනවා. එම නිසා වැඩි දෙනා ඩිස්පෙන්සරිවලට යන්නේ නැහැ. දොස්තර මහත්මයාගේ හෝ ඇපෝතිකරි මහත්මයාගේ හෝ ගෙදරට ගොස් මුදලක් ගෙවා බෙහෙත් ලබා ගැනීමට බොහෝ දෙනා පෙළඹී සිටිනවා.

**තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)

එහෙනම් හොඳ බෙහෙත් ටික ගෙදර වෙන්න ඇති.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

එහෙම වෙන්න ඇති. ඒ විධියේ පිළිවෙළක් තිබෙන බව මට අසන්නට ලැබී තිබෙනවා. එහෙත්, රජයේ ස්ථානවලදීම මුදල් ගන්නවායයි කීම ගැන අපට එතරම් විශ්වාසයක් තබන්නට බැහැ. ආණ්ඩුවේ ආරෝග්‍යශාලාවල ලොකු දොස්තර මහත්වරුන් නම් වෙනත් ක්‍රමයක් යොදාගෙන තිබෙනවා. පෞද්ගලිකව ලෙඩුන් බලා මුදල් අය කිරීම ඒ දොස්තර මහත්වරුන්ට තහනම් කළාට පසු, ඒ අය පෞද්ගලික දොස්තර මහත්වරුන්ගේ ආරෝග්‍යශාලාවලට ගොස් ඒ ස්ථානවලදී පෞද්ගලික වශයෙන් ලෙඩුන් පරීක්ෂා කර මුදල් ලබා ගන්නවා.

**විමලා කන්නන්ගර මිය.**
(திருமதி விமலா கன்னங்கர)
(Mrs. Wimala Kannangara)

"චැනල්ඩ් ප්‍රැක්ටිස්" යනුවෙන් ඒ ක්‍රමය ඇති කෙළේ පසුගිය ආණ්ඩුවයි.

දෙරබේරුව ආදි ස්ථානවලට ආණ්ඩුවේ බෙහෙත්ශාලා

**ටී. බී. තෙන්නකෝන් මයා.**
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

ආණ්ඩු ගැන මගේ කථාවක් නැහැ. දැන් ක්‍රියාත්මක වන පිළිවෙළවල් අනුව රටේ මිනිසුන්ට ඇති වී තිබෙන අමාරුකම් ගැන මිස ආණ්ඩු ගැන මා කථා කරන්නේ නෑ. දොස්තර මහත්වරුන් ගැනත්, බෙහෙත්ශාලා ගැනත්, බෙහෙත් දීම ගැනත්, නොයෙක් විධියේ අයුතු පිළිවෙළවල් යෙදී තිබෙන බව අපට අසන්නට දකින්නට ලැබෙනවා. හැම ව්‍යාපාරයකම අයුතුකම් සිදු වෙනවා. ඕවා නැති කරන්නට බැහැ. අයුතුකම් කරන පිරිසක් හැමදාමත් සිටිනවා. එය නැති කරන්නට නම් දැනට පවතින ක්‍රමය වෙනස් කළ යුතුයයි මාතර මන්ත්‍රීතුමා කළ ප්‍රකාශයට මා එකඟ වෙනවා. අයුතුකම් සිදු වන විට ඒවා ගැන හොයන්න බලන්න කෙනකු නැත්නම්, මසකට රු. 250 ක පඩියක් ලබන කෙනකු අවුරුද්දක් ඇතුළතදී රුපියල් දෙලක්ෂයක් එකතුකර ගත්තේ කෙසේදැයි ප්‍රශ්න කරන්නට කෙනකු නැත්නම්, ප්‍රශ්න කළත් ඒ ගැන නිසි අන්දමට කටයුතු කොට ඒ අයුතුකම් කළ අයට දඬුවම් පමුණුවන්නට පිළිවෙළක් නැත්නම්, මිනිසුන් හැමදාමත් ඒ අයුතුකම් කොට ලාභ ලබන්නට කල් පතා කරනවා. එය ස්වභාවික සිද්ධියක්. යම් කෙනකු අයුතුකමින් ධනය උපදවා ගෙන ලොකු ධනපතියකු වී සිටින විට, ඔහුට එය ඔහුගේ වාසනාවට ලැබුණායයි සිතා නිකම් නොසිට, එය ලැබුනේ කෙසේදැයි සොයා බැලීමට පිළිවෙළක් ඇති වන තුරු, අර ආණ්ඩුව මෙහෙම කළා මේ ආණ්ඩුව මෙහෙම කළා කීමෙන් කිසිම ප්‍රයෝජනයක් ඇති වන්නේ නැහැ. එයින් දැනට පවතින ක්‍රමයේ වෙනසක් වන්නේ නැහැ. පවතින ක්‍රමය වෙනස් කරන්නට පුළුවන් වන්නේ ක්‍රම දෙකකින් පමණයි. ඉන් එකක් නම් මිනිසුන්ගේ හැඟීම් වෙනස් කිරීමයි. අප කිසිම විටකවත් අයුතුකම් කරන්න නරකයි යන හැඟීම යම් දවසක මිනිසුන් තුළ ඇති වුණොත් ඒ මගින්, පවතින ක්‍රමය වෙනස් කරන්නට පුළුවනි.

එබඳු හැඟීමක් නැති නම් වරදට නිත්‍යානුකූලව දඬුවම් පැමිණ වීමේ පාලන ක්‍රමයකින් පමණයි මේ ප්‍රශ්නය විසඳිය හැකි



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජී. බී. තෙන්නකෝන් මයා.]

වන්නේ. ඒ කියන්නේ, හොඳ හිතින් හෝ භය කිරීමෙන් යන මේ ක්‍රම දෙකින් පමණයි මෙය කළ හැකි වන්නේ. එය එසේ වුණත්, හොඳින් පමණක්, යහපත් කමින් පමණක්, අවබෝධයෙන් යහපත් පුරවැසියන් වේය යන විශ්වාසයෙන් පමණක් අපේ සමාජය සංස්කරණය කරන්නට පුළුවන්වන බවක් මට නම් පෙනී යන්නේ නැහැ. කොයි තරම් බණ දහම් කියා දුන්නත්, අපේ රට ධම්මදීපයයි කීවත් අපේ මිනිසුන්ගේ ස්වභාවය අනුව, සාධාරණ අන්දමින් කල්පනා කර අව බෝධයෙන් යුක්තව, යහපත් පුරවැසියන් වීමට සූදානමක් තිබෙනවායයි අපට කිසි සේත් පිළිගන්න බැහැ. එම නිසා අපේ රට දියුණු කරන්න නම්, රටේ සාධාරණ යක් ඇති කරන්න නම්, මිනිසුන් කරන අකටයුතු අයුතුකම්වලට, රුසියාවේ වාගේ එක්තරා දරදඬු පිළිවෙළකට දඬුවම් කිරීමේ තත්ත්වයක් ඇති කළ යුතුය යන හැඟීමක් අපට ඇති වෙනවා. එබඳු දරදඬු පියවරක් නොගත්තොත් අද රට ගමන් කරන අන්දමට ජීවත්වීමට අපහසු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු අගමැතිතුමා දන්නවාදැයි මා දන්නෙ නැහැ, නමුත් සාමාන්‍යයෙන් කොයි ආරෝග්‍ය ශාලාවේත් පවතින තත්ත්වය නම්, රෝගියකු බැලීමට වත්පොහොසත් කම් ඇති උදවිය එනවා නම් පමණයි— තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තිබුණත්, අපේ ආණ්ඩුව තිබුණත්, කාගේ ආණ්ඩුව තිබුණත් තත්ත්වය එකයි—ඒ රෝගියාට සලකන්නේ. මේ ක්‍රමය පවතින තුරු කොයි ආණ්ඩුවක් තිබුණත් තත්ත්වයෙහි සැලකීමෙහි වෙනසක් සිදු වන්නේ නැහැ. ධනවත් අය එනවා නම්, බලවත් අය එනවා නම්, හොඳින් ඇඳපැළඳගත් උදවිය එනවා නම්, මන්ත්‍රීවරුන් එනවා නම්, ලොකු ලොකු මුදලාලිලා එනවා නම් ලෙඩා බලන්න, අන් අයට නොලැබෙන සැලකිලි, ආධාර, බෙහෙත්හේත් එම ලෙඩාට ලැබෙනවා. නමුත් අසරණ රෝගීන්ට ඒ කිසිම සැලකිල්ලක් ලැබෙන්නේ නැහැ ; කොයි අන්දමකින්වත් සහනයක් ලැබෙන්නේ නැහැ. ඒ උ[illegible]

දෙරබේරුව ආදි ස්ථානවලට ආණ්ඩුවේ බෙහෙත්ශාලා

දුකයි ; ආරෝග්‍ය ශාලාවට ගියාමත් දුකෙන්මයි කාලය ගත කරන්න වෙන්නේ. මේ අනුව බැරි මිනිහාට කාගේ පිහිටද ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ආරෝග්‍ය ශාලාවකට ගිය අවස්ථාවකදී එක් රෝගියකුගෙන් මා ඇසුවා, දොස්තර මහත්මයා ඇවිත් පරීක්ෂා කර බැලුවාද කියා. එවිට ඒ අසරණ රෝගියා මට කීවා, ඔහුට කළ වෙදකමක් නැති බවත්, ඔහු පරීක්ෂා කර බැලුවේ නැති බවත්, එසේ වුණත් ඇඳ ඉහද්දරින් එල්ලා ඇති බෝඩ් ලෑල්ලට නම් නිතරම වෙදකම් කරන බවත්. දොස්තර මහතා පැමිණ රෝගියාගේ ඇඳ ඉහද්දරින් ඇති විස්තර බලනවා මිස, සටහන් තබනවා මිස අසරණ රෝගියා පරීක්ෂා කර බලන්නේ නැති බව ඔහු කළ ප්‍රකාශයෙන් මට හැඟී ගියා. මෙන්න මෙබඳු තත්ත්වයකුයි ආරෝග්‍ය ශාලාවල දැන් පවතින්නේ. එම නිසා මේ තත්ත්වය නැති කර දැම්මටත්, අසරණ රෝගීන්ට හැකි තරම් සහනය සැලසීමටත් පියවර ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

එපමණක් නොවෙයි, රෝගීන් පරීක්ෂා කර බැලීම සඳහා ඇතැම් දොස්තරවරුන් විශාල ගාස්තු අය කරනවා. මෑතකදී එක්තරා රෝගියෙක් වෛද්‍යවරයකු කරා ගෙන ගියා. පරීක්ෂා කිරීමේ ගාස්තු වශයෙන් රෝගියාගෙන් රු. 23.50 ක් අය කළා. සාමාන්‍යයෙන් අපේ දුප්පත් උදවිය, ගම්බද අසරණ උදවිය බෙහෙත් ගන්න යන විට, තමා ළඟ මුදල් නැති නම් කාගෙන් හෝ රුපියල් දහයක් පමණ ඉල්ලා ගෙනයන සිරිතක් තිබෙනවා. නමුත් ඒ උදවිය රු. 23.50 ක් කොහොම ගෙවන්නටද ? දොස්තර මහතා ළඟට යන පුද්ගලයා අප වාගේ කෙනෙක් නම් පස්සෙ ගෙනැවිත් දෙන්නම් කියන්න පුළුවනි. එසේ වුණත් සාමාන්‍ය දුප්පත් කෙනෙක් දොස්තර කෙනෙකු ළඟට රෝගියෙක් ගෙන ගියොත් පස්සෙ දෙන්නම් කියා කියන්නට පුළුවන්කමක් නැහැ. අදහස් කළ වෛද්‍යවරයාගෙන් බෙහෙත් ගන්න බැරි වී රෝගියා මිය ගියොත් ඉන් පසුව රෝගියා අයිතිකාරයන් දුක් වෙනවා, එම දොස්තර මහත් මයාගෙන් බෙහෙත් අර ගෙන දෙන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුදල් නොමැති වීම නිසා රෝගියා මළාය කියා. එසේ කල්පනා වීමෙන් ඒ උදවියට විශාල දුකක් ඇති වීම ස්වභාවිකයි. මිනිසකුට අමාරුවක් වුණාම ඒ මාර්ගයෙන් තමන්ට යමක් සොයා ගැනීම ගැන තමයි බොහෝ දෙනා කල්පනා කරන්නෙ. කාටත් ලෙඩ රෝග සෑදෙනවා. නමුත් එක් මිනිසකු අසනීප වුණාම එයිනුත් ප්‍රයෝජනයක් ගන්නට, එයිනුත් තමන්ට යමක් සොයා ගන්නට තවත් මිනිසකු ලෑස්ති වෙනවා. එවැනි උදවිය අර අලියා මඩේ එරුණාම ඌ මැරෙන්නට ඉස්සර කන්නට රැස් වන කපුටන් වාගෙයි. ඒ තත්ත්වයෙන් මේ රටේ වෛද්‍ය කර්මය බේරා ගෙන සතුටුදායක තත්ත්වයක් ඇති කිරීමට කටයුතු කරනවා නම් ඉතාම හොඳයි. හිරියාලේ ගරු මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව මමත් සතුටින් අනුමත කරන අතරම මේ යෝජනාවට කුඩා අතුරු යෝජනාවකුත් ඉදිරිපත් කරනවා. හිරියාලේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කර තිබෙන ප්‍රදේශ පහ අතරට "ලේනදොර, අළුත්ගම, නාගහපොල සහ මිල්ලවාන යන ප්‍රදේශත් ඇතුළත් කළ යුතුය" කියා මා යෝජනා කරනවා

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
මා ඒ යෝජනාව සපිර කරනවා.

අ. භා. 3.3

**වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන**
(අම්බලංගොඩ)
*(வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன—அம்பலாங்கொடை)*
(Dr. M. H. Saddhasena—Ambalangoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිරියාලේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාව අනුමත කරමින් කථා කළ මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) බෙහෙත් ශාලා පිහිටුවීමේදී යම් අක්‍රමිකතා සිදු වෙනවාය, දුප්පතුන් සූරා නවාය, මේස උඩ මුදල් තබන්නට ෘය යන අදහසක් පළ කළා. ඒකට දෝෂාරෝපණය කළේ මේ ආණ්ඩුවටයි. නමුත් මා එතුමාට වචනයක් කියන්නට සතුටුයි. ආණ්ඩුවට දෝෂාරෝපණය කරනවා වෙනුවට අප සියලු දෙනාම එකතු වී, පගා ගන්න වෛද්‍යවරුන් සිටිනවා නම් ඔවුන්ට විරුද්ධව ජන මතයක් ඇති කරමු. හොද්දක ලුණු ටිකක් වැඩි වුණාම, මිරිස් ටිකක් වැඩි වුණාම, හයියෙන් ටිකක් කෑස්සාම වැඩ වර්ජනය කරන කොමියුනිස්ට් නායකයින් අප සමග පෙරමුණ ගෙන පගා ගන්න වෛද්‍යවරුන් සිටිනවා නම් ඔවුන්ට විරුද්ධව මහජන මතයක් ඇති කළ යුතු බව මා පෙන්වා දෙන්නට සතුටුයි. එසේ නොකර මේ ආණ්ඩුවට දෙස් පැවරීම අපරාධයක්.

තවත් චෝදනාවක් කළා. සමහර වෛද්‍යවරුන් නිකම් සුළුවෙන් ඇවිත් දැන් විශාල ගෙවල් දෙරවල් සාදාගෙන රාජකාරි කරමින් සිටිනවාය කියා චෝදනාවක් කළා. ඇයි අප මේ එක් පැත්තක් දෙස පමණක් කණ්ණාඩියෙන් බලන්නෙ? අර අහිංසක වෛද්‍යවරයා ගැන පමණක් සොයා බලන්නේ ඇයි? සමහර විට කබල් බයිසිකලයකින් ගිහින් මන්ත්‍රී කෙනෙකු වී ඇමතිවරයකු වී බෙන්ස් කාර්වලින් යන උදවිය මේ මන්ත්‍රී මණ්ඩලය තුළත් සිටින්නට පුළුවනි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
බොහොම හරි.

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
(Dr. Saddhasena)
මේ පැත්තේ නොවෙයි ඔය පැත්තෙ. ඇයි අප මේ අහිංසක රජයේ සේවකයා ගැන පමණක් සොයා බලා දෝෂාරෝපණය කරන්නෙ? මන්ත්‍රීවරුන් වශයෙන් පළමුවෙන් අපි පිරිසිදු වෙමු. ලොරිවලින් ගොස් කරවල විකුණ, කබල් බයිසිකලයකින් ගිය මිනිසා බෙන්ස් කාර් ගන්නවා; නව නගරයේ මාළිගා සාදනවා. ඇයි අර අහිංසක දුප්පතාට පමණක් දෝෂාරෝපණය කරන්නෙ? ගම්බද ප්‍රදේශවල සිටින්නේ දුප්පත් ජනතාවයි. ඔවුන්ට බෙහෙත් ගන්නට පගාව දෙන්නට සිද්ධ වී තිබෙනවා නම් වරායේදී හොද්දට ලුණු ටිකක් වැඩි වුණාම වර්ජනය



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය සද්ධාසේන]

කරන උදවිය ඇයි එවැනි වෛද්‍යවරුන්ට විරුද්ධව මහජන මතයක් ඇති නොකරන්නෙ? මේවා මහජන මුදලින් දෙන බෙහෙත්, මේවාට මුදල් ගෙවන්නට එපාය කියා මහජන මතයක් ඇති නොකරන්නේ මක්නිසාද කියා මා ප්‍රශ්න කරනවා. පුද්ගලයකු කරන ක්‍රියාවකට යම් ආණ්ඩුවකට දොස් කීම අපරාධයක්

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**

වෙඩි තියන්නෙ නැත්නම් ඔළු පළන්නෙ නැත්නම් පෙළපාලි යන්නට පුළුවනි.

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
**(Dr. Saddhasena)**

හයියෙන් ටිකක් කෑ ස්සත් වර්ජනය කරන උදවිය පගා දූෂණ මැඩලීමට අප සමග එකතු වී මහජන මතයක් ඇති නොකරන්නේ මක්නිසාද කියා මා නැවතත් ප්‍රශ්න කරනවා. පගාව දෙන්නට එපාය කියා අපි කවුරුත් එකතු වී මහජන මතයක් ගොඩනංවමු.

දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) ආයුර්වේදය ගැන කථා කළා. පැරණි යුගයේ තිබුණේ ආයුර් වේදයයි. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දියුණු කිරීමට මේ රජය විශාල පියවරක් ගෙන තිබෙනවා. ආයුර්වේද බෙහෙත් නිෂ්පාදනය කිරීමටත් දැන් ක්‍රියා කරගෙන යනවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. டீ. பி. தென்னகோன்)*
**(Mr. T. B. Tennekoon)**

මා කථා කළේ දේශීය වෛද්‍ය ක්‍රමය ගැනයි.

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
**(Dr. Saddhasena)**

තාත්තා ළඟ තිබෙන බෙහෙත් වව්වෝරුව පුතාට දෙන්නට මැරෙන මොහොත දක්වා බලා ගෙන ඉන්නවා. අවසාන මොහොතේදී වව්වෝරුව පුත්‍රයාට ආශයෝගය දෙන්නට බලාපොරොත්තු වන්නේ අවසාන හුස්ම යන විටයි. ඉතින් අවසානයේදී හුස්ම ටික යනවා. සංයෝගය දෙන්නට පුළුවන් වුණේ නැහැ. වෛද්‍යවරයාත් මැරුණා; බෙහෙතත් මැරුණා. එහෙත් එම තත්ත්වය නැති කරන්නට ජාතික රජය අළුත් ක්‍රියා මාර්ගයක් ආරම්භ කර තිබෙනවා. පරණ පුස්කොළ පොත් එකතු කර නව ක්‍රමය කට අනුව ආයුර්වේදය නංවාලීමට ක්‍රියා කර තිබෙනවා. මා මෙතෙක් වේලා කතා කළේ විරුද්ධ පාර්ශ්වයේ කථා කළ මන්ත්‍රීවරුන්ට පිළිතුරු වශයෙනුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දැන් අනික් පැත්තේ අඩුපාඩු ගැනත් කියන්නට කල්පනා කරනවා. බෙහෙත් ශාලා ඇති කිරීම පිළිබඳව රජයේ යම්කිසි ක්‍රියා පිළිවෙළක් තිබුණත් නොතිබුණත් මහජන වුවමනාවන්ට අනුව බෙහෙත් ශාලා යනාදිය ඇති කරන්නට යන අවසථා වලදී ඇති වන එක්තරා දුෂ්කරතාවයක් තිබෙනවා. රජයේ ක්‍රම සම්පාදක වැඩ පිළිවෙළක්ද මොකක්ද කෙහෙල්මලක් තිබෙනවා. ඒ ක්‍රමයෙන් අවසර නොලැබුණොත් ඩිස්පෙන්සරියක්වත් හදන්නට බැහැ. එම කාරණය ඔප්පු කිරීම සඳහා මගේ කොට්ඨාශයෙන්ම නිදසුනක් ඉදිරිපත් කරන්නට පුළුවනි. මගේ කොට්ඨාශයේ කිරිදිවැල නමින් ප්‍රදේශ යක් තිබෙනවා. ඉතා දුගී දුප්පත් ජනපද වාසීන් සිටින ප්‍රදේශයක් වශයෙන් මගේ කොට්ඨාශය හඳුන්වන්නට පුළුවනි. යටකී ප්‍රදේශයත් එම තත්ත්වයෙහිලා සලකන්නට පුළුවනි. සෞඛ්‍ය ඇමතිතුමි යත් දැන් මෙහි සිටින හෙයින් මෙම කාරණය සඳහන් කරන්නට මා කැමතියි. එම ප්‍රදේශයෙහි බෙහෙත් ශාලාවක් ඇති කරන්නට අවසර පැතූ අවසථාවේදී හිටපු සෞඛ්‍ය ඇමතිතුමා ඒ ගැන මොකවත් නොදන බැරිය කිව්වා. එහෙත් එතුමා බොහොම අමාරුවෙන් කැඳවාගෙන ගොස් පෙන්නු විට එය හොඳ බව කිව්වා. ඊළඟට දිසාපති තුමා ලවා ආණ්ඩුවේ ඉඩමකින් අක්කර බාගයකුත් වෙන් කරවාගෙන කටයුතු කරන්නට සූදානම් වුණා. ඒ පිළිබඳ ලියකියවිලිත් මා ළඟ තිබෙනවා. නමුත් මොකද වුණේ? ක්‍රම සම්පාදක ආශයා ඊට හරස් වුණා. ගරු නියෝජ්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමනි, එම ප්‍රදේශය ඉතා දිළිඳු ජනතාවක් වෙසෙන පළාතක්. 15,000 කට අධික ජනතාවක් එම ප්‍රදේශයේ සිටිනවා. රජයෙන් ශතයක් වත් නොමැතිව මහජන මුදලින් බෙහෙත් ශාලාවක් ලබා දෙන්නට කටයුතු කර ගෙන යන විට අපට ලැබුණු ලිපියෙහි මෙසේ සඳහන් වුණා :

**කිරිදිවලට මධ්‍යම බෙහෙත් ශාලාවක් ඉල්ලීම**

කිරිදිවැලට මධ්‍යම බෙහෙත් ශාලාවක් පිහිටුවීම සම්බන්ධයෙන් ක්‍රම සම්පාදක දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට අපහසු බව කරුණාවෙන් දන්වනු කැමැත්තෙමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම සිද්ධිය රජයට නින්දාවක් ; රජයට ලජ්ජා ගෙන දෙන කාරණයක්, ක්‍රම සම්පාදක දෙපාර්තමේන්තුවේ සිටින ශ්‍රෙෂ්ඨ පඬිවරයන් කල් යවන්නේ විදුලි පංකා යටයි ; මහ මැදුරු තුළයි. දුප්පත් ජනතාවගේ අවශ්‍යතාවයන් ගැන ඒ අයට දැනීමක් නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கா)*
(Mr. Prins Gunasekera)
එළියට ඇද දමන්න.

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
(Dr. Saddhasena)

ඇද දමන්න බැරි එකයි වරද. මම මේ ගැන කිව්වා. තවම උත්තරයක් නැහැ. ඊළඟට මේ අයගෙන් සැළැස්මක් ඉල්ලා සිටියා. එතකොට රුපියල් 80,000 ක් 90,000 ක් පමණ වියදම් කළ යුතු තත්ත්වයේ ගොඩනැගිලි සැළැස්මක් හැදුවේ එම දුප්පත් ජනතාවට කරන්නට බැරි පිළිවෙළටයි. ඒ පිළිබඳව මා යැවූ ලිපියකින් කොටසක් මෙසේයි :

...මධ්‍යම බෙහෙත් ශාලාවක ඇති අවශ්‍යතාවය ක්‍රම සම්පාදක දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරීන්ට නොපෙනී යාම ගැන මම පුදුම නොවෙමි. මන්දයත්, සෞඛ්‍ය පහසුකම් නොමැති දුප්පත් ජනතාව වෙසෙන ග්‍රාමීය පෙදෙසක ඇති නියම තත්ත්වය ඔවුන්ට අවබෝධකර ගැනීමට දුෂ්කර බවත් ගැමි ජීවන තත්ත්වය ගැන ඒ උදවියට පැහැදිලි අවබෝධයක් නොමැති බවත් මගේ වැටහීමයි...

දෙරබේරුව ආදි ස්ථානවලට ආණ්ඩුවේ බෙහෙත්ශාලා

මා ඒ පිළිවෙළටයි ලිව්වේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කියන ප්‍රදේශයෙහි සිටින්නේ දිනකට සිලිම් තුනක්වත් හම්බ කරන්නට බැරි තරම් දුප්පත් උදවියයි. එහෙත් බෙහෙත් ශාලාවක් ලබා ගැනීමට තිබෙන ආසාව නිසා තමන් උපයන සුළු මුදලෙන් දිනකට ශත 25 බැගින් හෝ වෙන්කොට ඊට යොදවන්නට ඔවුන් කල් පනා කළා. ඒ සඳහා කටයුතු යොදා තිබියදී මෙන්න මේ කියන කෙහෙල්මල් ක්‍රම සම්පාදක අංශය එක පෑන් පහරකින් ඒ සඳහා අනුමැතිය දෙන්නට බැරිය කීවා. මේකද දුප්පතාට සේවය කරන පිළිවෙළ කියා මා අහනවා. සෞඛ්‍ය කටයුතු පිළිබඳ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමිය මේ ගැන ලජ්ජා වියයුතුයි. ගම්බද ජනතාවගේ අවශ්‍යතාවයන් දන්නා මහජන මන්ත්‍රීවරුන් සහ මහජනතාව යම් යම් දේ ඉල්ලා සිටි විට ඒ සඳහා මුදල් නැති බව කියනවා. ඊළඟට මහජනතාව තමන්ගේ ධනය සහ ශ්‍රමය වැය කොට එම කටයුතු කරන්නට සූදානම් වූ විට මේ කියන කෙහෙල්මල් ක්‍රම සම්පාදක අංශයේ අනුමැතිය අවශ්‍යයි කියනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கா)*
(Mr. Prins Gunasekera)
කෙහෙල්මල් ආණ්ඩුව!

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
(Dr. Saddhasena)

මේක එහෙම ආණ්ඩුවක් නොවෙයි. මේ ආණ්ඩුව බොහොම හොඳයි. අර කරවල විකුණු කාලයේ තමයි, එහෙම ආණ්ඩුවක් තිබුණේ. මේ ආණ්ඩුව එහෙම එකක් නොවෙයි. එහෙත් මේ ආණ්ඩුවේත් ඔය කියන ලද අන්දමට යම් යම් වැරදි තිබෙනවා. ඒ වැරදිවලට ඉඩ දෙන්නේ මන්දැයි ආණ්ඩුවේ මන්ත්‍රීවරයකු වශයෙන් ප්‍රශ්න කරන්නට මට සිදු වී තිබෙනවා. ඔය කෙහෙල් මල් ක්‍රම සම්පාදනය නවත්වා මහජන අවශ්‍යතා සම්බන්ධයෙන් මහජනයා ඉදිරිපත් වී වැඩ කරන විට ඒ සම්බන්ධයෙන් ආණ්ඩුවේ ආධාරය දිය යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය සද්ධාසේන]

මධ්‍යම බෙහෙත් ශාලා සංචාරක බෙහෙත් ශාලා මේ කාලය තුළදී ඇති නොකළ යුතු බවට ආණ්ඩුව තීරණයක් ගෙන තිබෙනවාලු. ජනගහණය නම් දිනෙන් දිනම වැඩි වෙනවා. 'මාවෝ' උණත් දැන් පැතිරීගෙන යනවා. [බාධා කිරීමක්] කොයි එකක් හරි වේවා, දැන් බෝ වන උණක් පැතිරෙමින් පවතිනවා. මෙවැනි අවස්ථාවකදී වැඩි වැඩියෙන් වෛද්‍ය පහසුකම් සලස්වන්නට ඕනෑ. මෙවැනි අවස්ථාවකදී මුදල් තත්ත්වය අනුව කල්පනා කර බලා වැඩ කරන්නට යන්න හොඳ නැහැ.

අද ඇපෝතිකරිවරුන් පුහුණු කෙරෙන්නේ නැහැ. මා නියෝජනය කරන කොට්ඨාශයේ එක්තරා ආරෝග්‍යශාලාවක් තිබෙනවා. ඒ ආරෝග්‍යශාලාවට ඇපෝති කරි කෙනකු වෙනුවට දෙස්තර මහතකු එවන්නට සෞඛ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමිය පොරොන්දු වුණා. එහෙත් තවමත් ඒ අනුව කටයුතු සිදු වුණේ නැහැ. ඔන්න, අද පවතින තත්ත්වය. මහජනයාට අවශ්‍ය පහසුකම් අවශ්‍ය අවස්ථාවේදී සලසා දීම රජයේ යුතුකමයි. මිනිසුන් මැරුණායින් පසුව ඒ පහසුකම් සැලැස්වීමෙන් වැඩක් නැහැ. අනෙක් කාරණා කෙසේ වුවත් ආහාර සහ සෞඛ්‍ය පහසුකම් සලස්වා දීම ඉතාමත්ම අවශ්‍යයි. සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා දුප්පත් මහජනයා මුදල් වියදම් කර කටයුතු කරන අවස්ථාවේදී මේ ක්‍රම සම්පාදක යයි කියන අමාත්‍යාංශයකින් අනුමැතිය ගන්නට ඕනෑ වන්නේ මන්දැයි මට තේරුම් ගන්නට බැහැ. ඔවුන් දන්නේ මොනවාද? හොඳ බංගලාවල පංකා යටට වී ජීවත්වන ඔවුන් දුප්පත් ගම්බද ජනතාවගේ අවශ්‍යතා ගැන දන්නේ කොහොමද? දුප්පත් ජනතාව තමන්ගේ වියදමින් මධ්‍යම බෙහෙත් ශාලාවක් ඉදි කිරීමට සතුට ප්‍රකාශ කර ඊට සූදානම් වුණේ, අහක දාන්නට තරම් මුදල් ඔවුන්ට තිබෙන නිසාද? මුට්ටි කාසි එකතු කළ ඒ මුට්ටි පොළොවේ ගසා ඔවුන් අපට විරුද්ධව නැගී එන්නට කටයුතු සැලසෙන්නේ මේ ක්‍රම සම්පාදකයන්ගේ අනුමැතිය ලබා ගන්නට යෑමෙනුයි. ඒ නිසා මේ දිරච්ච වැටවල්වලට පයින් ගසා කඩා දමා නියම ප්‍රජාතන්ත්‍රවාදය අනුව කටයුතු කරමින් සෞඛ්‍ය පහසුකම් සැලැස්වීමට ක්‍රියා කරන මෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 3.15

**එස්. ද එස්. ජයසිංහ මයා.**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*

(Mr. S. de S. Jayasingha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිරියාල ගරු මන්ත්‍රීතුමා (එස්. බී. හේරත් මයා.) විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අපේ සහයෝගය ලැබෙනවා. ගමනාගමන පහසුකම් අඩු ගම්බද ප්‍රදේශවලට ආරෝග්‍යශාලා එසේ නැත්නම් බෙහෙත් ශාලා තිබිය යුතු බව හිරියාල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවෙන් සක් සුදක් සේ පැහැදිලි වෙනවා. අද ජනගහණය වැඩි වීම ගැන කල්පනා කර බලන විට නොදියුණු ප්‍රදේශවලට මේ අන්දමට බෙහෙත් ශාලා අතවශ්‍ය බව කාටත් පෙනී යන දෙයක්. දැන් මේ රටේ මැලේරියා රෝගය එක්තරා ප්‍රමාණයකට හිස උස්සාගෙන අවුත් තිබෙනවා. ඒ අතරම "හොංකොං" නමින් හෝ "මාවෝ" නමින් හෝ මොන නමින් හෝ හඳුන් වන උණ රෝගයකුත් රට පුරා පැතිරීගෙන යනවා. මෙවැනි තවත් නොයෙක් කරදරකාරී ලෙඩ රෝග ඇති වන්නට බැරි නැහැ. ඉස්සර නම් කොත්තමල්ලි, පත්පාඩම් හා වෙනිවැල්ගැට ටිකකින් සුව කර ගන්නට පුළුවන් රෝගයක් සම්බන්ධයෙන් එවැනි බෙහෙත් පාවිච්චි කිරීමට මහජනයා පෙළඹුණත් අද මහජනයා තුළ ඒ බෙහෙත් ගැන ඒ තරම් අවබෝධයක් නැති නිසා දෝ ඉංග්‍රීසි වෛද්‍ය ක්‍රමය අනුව ප්‍රතිකාර ලබා ගන්නට ඔවුන් නිතරම බලාපොරොත්තු වෙනවා. ඒ සිංහල බෙහෙත් හදා ගන්නට ටිකක් මහන්සි වන්නට තිබෙන නිසා මිනිසුන් ඊට ටිකක් මැළි වනවාත් විය හැකියි. ඒ වාගේම ආණ්ඩුවේ දිස්පැන්සරියෙන් නොමිළයේ බෙහෙත් ලබා ගන්නට පුළුවන් නිසා කවුරුනුත් වාගේ ඊට පෙළඹෙනවාත් විය හැකියි. ඒ අතරම, ආණ්ඩුවේ බෙහෙත් ශාලාවෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බෙහෙත් ලබා ගැනීම තමන්ගේ අයිතිවාසිකමක් හැටියට සමහරුන් කල්පනා කරනවා. මහජනයා ආරක්ෂා කිරීම රජයේ යුතුකම නිසා රජය ඒ යුතුකම ඉෂ්ට කළ යුතු යයි මහජනයා කල්පනා කරනවා.

දකුණු කොළඹ ආරෝග්‍යශාලාවක් ඇති කළ යුතු යයි මා 1953 කාලයේදී මෙම ගරු සභාවේ යෝජනාවක් ඉදිරිපත් කළා. එය එදා පිළිගත්තා. ඊට පසුව නොයෙක් අවස්ථාවලදී ප්‍රසිද්ධ වේදිකාවලදී එම යෝජනාව සමච්චලයට භාජන කළා. ඒ පුද්ගලයන්ගේ නම් මා අවස්ථාවේදී සඳහන් කරන්න බලාපොරොත්තු නොවන්නේ ඒ අය මේ ගරු සභාවේ දැන් නැති නිසයි. "ජයසිංහගේ සෙප්පඩ විජ්ජාවක්" කියාත් ඒ යෝජනාව සම්බන්ධයෙන් ප්‍රසිද්ධ වේදිකාවලදී කියන්න යෙදුනා. නමුත් අවසානයේදී ආරෝග්‍යශාලාව ඉදි කළා. අද දවසකට රෝගීන් 3,000 ක් පමණ, සමහර විට ඊටත් අධික සංඛ්‍යාවක්, එම ආරෝග්‍යශාලාවෙන් ප්‍රතිකාර ලබා ගන්නවා. "Outpatients Dispensary" එකෙන් රෝගීන් 3,000 ක් පමණ දිනකට බෙහෙත් ගන්නවා. නේවාසික රෝගීන් හැර බෙහෙත් ලබා ගෙන යන රෝගීන්ම එපමණ සිටිනවා. නේවාසික රෝගීන් සඳහා තිබෙන්නේ ඇඳන් 750 ක් පමණයි. නමුත් සමහර විට නේවාසික රෝගීන් 1,000 ක් පමණ රෝහලේ නැවතී ප්‍රතිකාර ලබා ගන්නවා. ඒ ප්‍රදේශය එතරම්ම ජනාකීර්ණ නැහැ. ඒ අවට සුළු නගරවලිනුත් බෙහෙත් ලබා ගැනීමට එන රෝගීන් නිසායි විශාල පිරිසක් හැම විටම එම රෝහලට එකතු වෙන්නෙ. මෙම ආරෝග්‍යශාලාව අද ඉතාමත් ජනප්‍රිය වී තිබෙනවා. ඒ වගේම අපට තවත් සතුටු විය හැකි කරුණක් නම් ආරෝග්‍යශාලාවල සේවය කරන අය ජනප්‍රිය වන විට ඒ රෝහලට ඇදෙන ලෙඩුන්ගේ සංඛ්‍යාවද වැඩි වීමයි.

මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවෙ මයා.) රජයේ රෝහල්වල සිටින වෛද්‍යවරුන් යම් යම් පාරිතෝෂික මුදල් ලබා ගන්නා බවක් කියන්න යෙදුනා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ සේවකයන් අතර හෝ වේවා, පුද්ගලික අංශයේ වැඩ කරන අය අතර හෝ වේවා හැම දෙනාගේම අදහස් එක වගේ නොවෙයි. සැම දෙනාගේම ක්‍රියා පටිපාටිය එක වගේ නොවෙයි. සැම දෙනාගේම අවංකභාවය එක වගේ නොවෙයි. ඒ නිසා අපේ සමාජයේ නා නා ප්‍රකාර අදහස් ඇති අය, නා නා ප්‍රකාර බලාපොරොත්තු ඇති උදවිය සිටිනවා විය හැකියි. ඒ නිසා එවැනි වෛද්‍යවරුනුත් සිටිනවාට කිසිම සැකයක් නැහැ. නමුත් හැම දෙනාටම එක හැන්දෙන් බෙදීම බලවත් වරදක්. මට නිර්භයව කියන්න පුළුවනි, අද කොළඹ මහ ආරෝග්‍යශාලාවට පමණක් දෙවැනි වන ඒ තරම්ම ජනාකීර්ණ වන දකුණු කොළඹ ආරෝග්‍යශාලාවට දවසකට ඔය එන 3,000 ක් පමණ රෝගීන්ගෙන් කවදාවත්ම ඔය විධියේ පැමිණිල්ලක් මට ලැබුනේ නැති බව. මගේ නිවාසෙ සිට කෙළින්ම බැලුවොත් හැතැප්ම බාගයක් පමණත් පාරේ සිට එනවා නම් සැතැප්මක් පමණක් දුරිනුයි ඔය ආරෝග්‍යශාලාව පිහිටුවා තිබෙන්නේ. නමුත් අපට නම් කිසිම කෙනෙක් අද වන තෙක්ම පැමිණිල්ලක් කර නැහැ, එහි සේවය කරන අය මුදල් බලාපොරොත්තුවෙන් කටයුතු කරනවාය කියා. වෛද්‍යවරුන් පමණක් නොව—බොහෝ දෙනා බෙහෙත් ලබා ගන්න ඒන්නේ ඕ. පී. ඩී. එකටයි—ඕ. පී. ඩී. එකේ සේවය කරන අනිකුත් සේවකයින් හෝ එවැනි පාරිතෝෂික මුදලක් ගන්නවාය කියා මට නම් පැමිණිල්ලක් ලැබී නැහැ. දිනපතා විශාල සංඛ්‍යාවක් ඒ ස්ථානයට බෙහෙත් ලබා ගන්න ආවත් ඔය විධියේ චෝදනාවක් අද වන තෙක් අපට නම් අසන්න ලැබී නැහැ. සමහර තැන්වල එවැනි අය නැතුවා නොවෙයි. නමුත් ඒ විධියේ කටයුතු නොකරන අයගේ ආත්ම ගෞරවය අපි සැම අවස්ථාවකදීම ආරක්ෂා කර ගන්න ඕනෑ. බොහෝ විට ඔය රෝගීන් ආරෝග්‍යශාලාවට ඇතුල් කර ගැනීම් ආදිය සම්බන්ධයෙන් නම් අපේ ගෙදරට ඇවිත් කරදර කරන අවස්ථා තිබෙනවා. නමුත් ඔය විධියේ පැමිණිල්ලක් නම් කවදාවත්ම ලැබී නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස් ජයසිංහ මයා.]

ඊළඟට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සිංහල වෛද්‍ය ක්‍රමය අනුව නගරවලත් ගම්වලත්, ගම්සභා, පළාත් ආණ්ඩු සභා හා මහ නගර සභා මාර්ගයෙන් ආයුර්වේද බෙහෙත් ශාලා මහා රාශියක් විවෘත කර තිබෙනවා. ඒවා ප්‍රයෝජනයට නොගත් නවා නොවෙයි. නමුත් සුළු දෙයකට වුවත් ඉංග්‍රිසි වෛද්‍යවරයන් සොයා යාමට අද අපේ ජනතාව පුරුදු වී සිටිනවා. අද අපේ ජනතාව පොඩි තුවාලයකට වුණත්, ඉංග්‍රිසි ප්‍රතිකාර සොයා ගෙන යන්නම පුරුදු වී සිටිනවා. අපි සිතමු, අතේ කටු වක් ඇනුනාය කියා. අපි කුඩා කාලයේත් අපේ අත්වල කටු ඕනෑ තරම් ඇනී තිබෙනවා. අපි නගරවල උපන් අය නො වෙයි, ගම්වල ඉපදුන අයයි. අපි කරන්නේ කටුව ඇදල දමා තුවාලයට කදුරු කිරි ටිකක් දමා ඔතා ගැනීමයි. නමුත් අද ඒ විධියට කටුවක් ඇනුනොත් කාරෙකකින් බෙහෙත් ශාලාවකට ගොස් ඉන්ජෙක්ෂන් එකක් ගසා ගෙන, ලොකු බැන්ඩේජ් එක කුත් දමා ගෙන රජයෙන් රුපියල් 25 ක් පමණ වියදම් වන විධියට කටයුතු කර නවා. ඒ වගේම පැන්සලයක් කපන්න ගොස් ඇඟිල්ල කැපුනොත් අපි කරන්නේ එඬරු කිරි ටිකක් දමා ඇඟිල්ල රෙදි පටි යකින් ඔතා ගැනීමයි. නමුත් අද සිදු වන්නේ එය නොවෙයි. ඒ නිසා අද ජන තාව පුරුදු වී සිටිනවා පැරණි වෛද්‍ය ක්‍රම අත්හැර දමා නවීන ක්‍රමයටම බෙහෙත් පාවිච්චි කරමින් සෑම පහසුකමක්ම ලබා ගැනීමට. එවැනි තත්ත්වයක් ඇති වී තිබෙන මේ අවදියේදී සෑම ප්‍රදේශයකම මෙවැනි ආරෝග්‍යශාලාවල් ' නැත්නම්, බෙහෙත් ශාලාවල්—බෙහෙත් බෙදා දෙන මධ්‍යස්ථාන—ඇති කළ යුතු බව අපි පිළි ගන්න ඕනෑ.

විශාල නගරවලටත්, උප නගර වලටත් අයිති ප්‍රදේශවලට ගමන් පහසුව තිබෙනවා. ආරෝග්‍යශාලාවල් තර මක් ඈත තිබුණත් ගමන් පහසුව ඇති නිසා තමන්ගේ වුවමනාවල් ඉෂ්ට කර ගන්නට පුළුවන්කම තිබෙනවා. හැතැප්ම දහයෙන් දහයට ආරෝග්‍යශාලා තිබුණත් ඒ ප්‍රදේශවාසීන්ට ගමන් පහසුව තිබෙන නිසා වැඩි කරදරයක් නැතිව එයින් ප්‍රයෝජන ගන්නට පුළුවන්කම ලැබෙනවා. ගම්බද බොහොමයක් ප්‍රදේශ



වල ගමන් පහසුකම් නැහැ. ලෙඩා ඇඳක හෝ පුටුවක හෝ තබාගෙන කර ගහගෙන පාරක් දක්වා ගමන් කරන්නට සිදු වන ගම්බද ප්‍රදේශ තවමත් ඇති බව අප දන්නා කාරණයක්. ඒ ආකාරයට පාරකට ආවායින් පසුත් තරමක් කරදර විඳගෙනයි වාහනයකට ලෙඩා ඇතුළු කර ගන්නට ලැබෙන්නේ. සර්පයකු විසින් දෂ්ට කරනු ලැබූ දරුවකු රැගෙන එක්තරා මාතාවක් වෛද්‍යවරුන් කීප දෙනකු කරා ගිය බවත්, එහෙත් නියම අන්දමට ප්‍රතිකාර කලට වේලාවට කර ගන්නට බැරි වීම නිසා දරුවා මිය ගිය බවත් අද පත්‍රයේ දකින්නට ලැබුණා. එවැනි ප්‍රවෘත්ති රාශි යක් අපට වරින්වර කියවන්නට ලැබෙ නවා. ගමන් පහසුව නැති ප්‍රදේශවල ලෙඩුන් කර ගහගෙන දෙතුන් දෙනා ගමන් කරන හැටි නොයෙක් අවස්ථාවල අපට දකින්නට ලැබී තිබෙනවා. විශේෂ යෙන්ම හිරියාල ප්‍රදේශයේ එවැනි තැන් තිබෙනවා. කඳුකර ප්‍රදේශවල විශේෂ යෙන්ම මාර්ග පහසුකම් නැති තැන්වල කන්දේ ඉහළ සිට පහළට බොහොම අමාර වෙන් ලෙඩුන් කර ගහගෙන යන අවස්ථා අපට දකින්නට ලැබෙනවා. හැතැප්ම ගණන් පල්ලම් බහින්නට සිදු වන තැන් තිබෙනවා. හිරියාලේ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවෙන් අපේක්ෂා කරන සෞඛ්‍ය පහසුකම් ඉතාමත් ඉක්මනින් ඒ ප්‍රදේශ යේ ජනතාවට දීම ගැන සෞඛ්‍ය අමාත්‍යාංශය සලකා බලනු ඇතැයි මා විශ්වාස කරනවා. ගරු මන්ත්‍රීතුමා ඉල්ලා තිබෙන පහසුකම් ලැබේවායයි ප්‍රාර්ථනා කරමින් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමියට පිළිතුරු කථාව කරන්නට කාලය වුවමනා කරන බැවින් ඊට ඉඩ දෙමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 3.25

**ඒ. අමිර්තලිංගම් මයා.** (වඩ්ඩුකොඩෙයි)
(திரு. ஏ. அமிர்தலிங்கம்—வட்டுக் கோட்டை)
(Mr. A. Amirthalingam—Vadduk-koddai)

கௌரவ உபசபாநாயகர் அவர்களே, கௌரவ ஹிரியாலப் பிரதிநிதி (திரு. எஸ். பி. ஹேரத்) அவர்களின் பிரேரணையை ஆதரித்து நானும் இச்சந்தர்ப்பத்தில் சில வார்த்தைகள் கூற விரும்புகிறேன். இன்று இந்த நாட்டி

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ுள்ள பெரிய அரசாங்க வைத்தியசாலைகளில் எல்லாம் தாங்க முடியாத ஜனநெருக்கடியான நிலைமை ஏற்பட்டிருக்கின்றதென்பதை எல்லோரும் அறிவார்கள். பெரிய வைத்தியசாலைகளில் மருந்துபெறச் செல்லும் சாதாரண நோயாளிகள் இன்று பல மணிநேரம் காத்திருக்க வேண்டியிருக்கின்றது. இதைத் தவிர்க்க வேண்டுமென்றால் நோயாளிகளுக்கு மருந்து சுலபமாகக் கிடைக்கக்கூடிய வகையில் கிராமங்களில் எல்லாம் மருந்துச்சாலைகள் நிறுவப்பட வேண்டும். இதைத் தவிர பெரிய வைத்தியசாலைகளில் உள்ள நெருக்கடியைத் தவிர்க்க வேறு வழியில்லை.

கடந்த சில ஆண்டுகளாக சுகாதார அமைச்சு சமர்ப்பிக்கும் திட்டங்களை எல்லாம் பிரதமர் அவர்களுடைய ஆணையின்கீழ் இயங்கும் திட்ட அமைச்சு நிராகரித்து வருவதாக அறிகிறோம். பல்வேறு துறைகளில் அத்தியாவசிய தேவை என்று கருதப்பட்டு, மாவட்ட இணைப்புக் குழுக்கூட்டங்களாலும் ஏற்றுக்கொள்ளப்பட்டு, பின்னர் சுகாதார அமைச்சினாலும் அங்கீகரிக்கப்பட்டுள்ள திட்டங்கள் பல திட்ட அமைச்சுக்குச் சமர்ப்பிக்கப்படும்பொழுது அங்கே நிராகரிக்கப்படுவதாகக் கூறப்படுகின்றது. ஏழை மக்களுக்குத் தேவையான பல தேவைகள் நிறைவேற்றப்படாமல் கைவிடப்படுகின்றன. இதனால் ஏழை மக்களுக்கு மிகவும் கஷ்டமான ஒரு சூழ்நிலை உருவாகி வருகின்றது. இந்த நாட்டில் எத்தனையோ தேவையற்ற விடயங்களுக்கெல்லாம் கோடிக்கணக்கான ரூபா செலவு செய்யப்பட்டு வருகின்றது. ஆனால் ஏழை மக்களுக்குத் தேவையான வைத்திய வசதிகளைச் செய்து கொடுப்பதற்காகத் தயாரிக்கப்படும் திட்டங்களை ஏன் நிராகரிக்க வேண்டுமென்று விளங்கவில்லை.

சென்ற ஆண்டு எந்தவிதமான புதிய கட்டடங்களையோ அல்லது நிலையங்களையோ நிறுவ முடியாதென்று சுகாதார அமைச்சு கைவிரித்து விட்டது. காரணம் திட்ட அமைச்சு அவற்றை நிராகரித்து விட்டதாகக் கூறினார்கள். இந்த ஆண்டும் இத்தகைய திட்டங்களுக்கு என்ன கதி ஏற்படுமென்று தெரியவில்லை. எங்கள் ஒவ்வொருவரது தொகுதியிலும் அத்தியாவசிய தேவைகள் பலவற்றை நாம் சுகாதார அமைச்சர் அவர்களுக்கு இந்த ஆண்டு சமர்ப்பித்து இருக்கிறோம். அவரும் அவற்றை ஏற்றுக்கொண்டு ஒவ்வொரு தொகுதியிலும் ஒவ்வொரு வேலையையாவது நிறைவேற்றுவதாக வாக்குறுதி அளித்திருக்கிறார். அவருடைய அந்த வாக்குறுதிக்கு என்ன தடை ஏற்படுமோ எமக்குத் தெரியாது.

அரசாங்கக் கட்சி உறுப்பினர் ஒருவர் இங்கே கொண்டு வந்திருக்கும் இப் பிரேரணையை நாம் ஆதரிக்கிறோம். திட்ட அமைச்சு அத்தியாவசியமான விடயங்களை நிராகரித்து ஒதுக்காமல் பின் தங்கிய தொகுதிகளின் வைத்திய வசதிகளுக்கு வேண்டிய பணத்தை ஒதுக்க வேண்டும். கௌரவ சுகாதார அமைச்சரும் அவருடைய பாராளுமன்றக் காரியதரிசி அவர்களும் இச்சபையிலுள்ள பின்வரிசை அங்கத்தவர்களுடைய குரலுக்குச் செவி சாய்த்து எங்களுடைய தேவைகளையெல்லாம் நிறைவேற்றிக் கொடுப்பார்கள் என்று நம்பிக்கை தெரிவித்து எனது உரையை முடித்துக் கொள்ளுகிறேன்.

අ. භා. 3.29

**විමලා කන්නන්ගර මිය.**
(திருமதி விமலா கன்னங்கர)
(Mrs. Wimala Kannangara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිරියාලේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද, ඩිස්පෙන්සරි පිහිටුවීම පිළිබඳ අත්‍යවශ්‍ය යෝජනාව මේ ගරු සභාවේ දී මෙපමණ වේලාවක් සාකච්ඡාවට භාජන වුණා. ඒ යෝජනාව ඉදිරිපත් කිරීමෙන් ඒ ගරු මන්ත්‍රීතුමා බලාපොරොත්තු වුණේ දෙරබේරුව, දගම, සිරාදුන්න, හුණුපොල හා දිද්දෙනියේ ආණ්ඩුවේ බෙහෙත් ශාලා ඇති කිරීමයි. ඒ සම්බන්ධයෙන් මට කියන්නට තිබෙන්නේ මෙයයි. මේ ගම්වල සිට බෙහෙත් ශාලාවට දැනට තිබෙන වැඩිම දුර ප්‍රමාණය හැතැප්ම අටයි. මහල්පොත මැදි බෙහෙත්හල හැතැප්ම පහක් ඈතින් පිහිටා තිබෙනවා. බෙහෙත් ශාලාවක් පිහිටුවීමට දුර බැහැර ප්‍රදේශවල ජනගහනය දෙදහක් පමණ විය යුතු බැවින්, මෙහි ජනගහනය අනුව දැනට එහි බෙහෙත් ශාලා පිහිටුවීම ගැන සලකා බැලීමට නොහැකි වෙනවා. පොල්පිතිගම මකුල්පොත මැදි බෙහෙත්හල හැතැප්ම පහක් පමණ දුරින් ඇති බැවිනුත්, ඒ ප්‍රදේශයේ ජනගහනය 1,800ක් පමණ වන හෙයිනුත්, ජනගහනය පිළිබඳ නීතිය අනුව බලන විට ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මිය.]

ගැනත් තව දුරට සොයා බලා කටයුතු කරන්නට සිදු වෙනවා. සීරාදුන්නෙ ජන ගහනය 1,600යි. සෞඛ්‍ය දෙපාර්ත මේන්තුවේ චක්‍ර ලේඛන අනුව කටයුතු කළ යුතුව තිබෙන නිසා ඒ ගැනත් සලකා බලා ඉදිරිපත් කරන ලද සංශෝධනය අනුවත් සම්පූර්ණයෙන් සලකා බලා කටයුතු කරන්නට සිදු වන බව සඳහන් කරන්නට ඕනෑ.

මේ විවාදයේදී නොයෙක් නොයෙක් ප්‍රශ්න ඉදිරිපත් කළා. ඒවාට පිළිතුරු දීම සුදුසුය කියා මා කල්පනා කරනවා. ඇපොතිකරිවරුන් බෙහෙත් ශාලාවල බෙහෙත් දීම පිළිබඳව මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) චෝදනා ඉදිරිපත් කළා. වරක් ඒ මන්ත්‍රීතුමා කිව්වා, දිස්පෙන්සරිවල දෙන්නේ වතුර පමණය කියා. ඊට පසුව කිව්වා, හොඳ බෙහෙත් තියෙනවාය, මිනිසුන් සල්ලි දී ඒවා ලබා ගන්නවාය කියා. ඒ සමගම කිව්වා, ඇපොතිකරි මහත්වරුන් සේවයට සුදුසු නැත, ඊට වඩා උසස් වෛද්‍ය නිලධාරීන් පත් කරන්න ඕනෑය කියා. අද ලංකාවේ ඇපොතිකරි ක්‍රමය අහෝසි කර අවසාන බව ඒ මන්ත්‍රීතුමාගේ දැන ගැනීම පිණිස කියන්නට කැමතියි. එහෙත් අද ලංකාවේ මැරීගෙන යන ඇපොතිකරි යුගයට අයිති ඇපොතිකරි මහත්වරුන් පන්නා දමන්නට බැහැ. ඒ අය විශ්‍රාම ගැනීමෙන් පසුව ලංකාවේ ඇපොතිකරි ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි වෙනවා. අවුරුදු 2 ක සිට ඇපොතිකරිවරුන් පුහුණු කිරීම සම්පූර්ණයෙන්ම නවත්වා තිබෙනවා. දැන් ඇපොතිකරි මහත්වරුන් බඳවා ගන්නෙත් නැහැ; පුහුණු කරන්නෙත් නැහැ. ඇපොතිකරි මහත්වරුන් සේවය කරන තැන්වලට "ඉන්ටර්න්ස්" කියන සම්පූර්ණ වෛද්‍ය පුහුණුවක් හා සුදුසුකම් තිබෙන ආධුනික නිලධාරීන් පත් කරනවා. අළුතෙන් බඳවා ගන්නා දොස්තර මහත්වරුන්ට පිට පළාත්වල තිබෙන දිස්පැන්සරිවල ඇපොතිකරි මහත්වරුන් වෙනුවට සේවය කිරීමට කටයුතු යොදා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් යම් චෝදනා ඉදිරිපත් කළා. අද පමණක් නොවෙයි, බුදුරජාණන් වහන්සේගේ කාලයෙත් වංක උදවියත් සිටියා; අවංක උදවියත් සිටියා. රජයේ සේවයේත්



ගෙනුත් වැරදි සිදු වෙනවා. මාසයකට පැමිණිලි රාශියක් මටම ලැබෙනවා. ඒ පැමිණිලි නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත යැව්වාම ඒවා ගැන පරීක්ෂණ පවත්වනවා. එසේ පරීක්ෂණ පවත්වන විට සමහරවිට ඒ ලියුම් අත්සන් කළ උදවියවත් සාක්ෂි දෙන්නට එන්නේ නැහැ. අපේ නිලධාරීන් රහස් පරීක්ෂකයන් වශයෙන් ගම්බද මනුෂ්‍යයන් හැටියට සරම, බැනියම ඇඳ ගෙන පෝලිම්වල සිට කරුණු සොයවන්නට යවනවා. එසේ කරන ලද පරීක්ෂණ අනුව දඩ ගසන ලද උදවියගේත්, විනයානුකූලව දඬුවම් කරන ලද උදවියගේත් ලැයිස්තු වුවමනා නම් ඉදිරිපත් කරන්නට පුළුවන්. මේවා මේ ආණ්ඩුවෙවත්, පසුගිය ආණ්ඩුවෙවත් වැරදි නොවෙයි. ලංකා සමාජයේ අවංක භාවයක් ඇති වන තුරු කාටවත් මෙය නැති කරන්නට බැහැ. පසුගිය ඡන්ද කාලයේදී මාත් වේදිකාවල කෑගැහුවා, ආරෝග්‍යශාලාවල තියෙන්නේ බෙහෙත් නොවේය, වතුර පමණය කියා. නමුත් දැන් ඒ තත්ත්වය සියයට 60 ක් 70 ක් පමණ ශුද්ධ කර තිබෙනවා. බෙහෙත් යැවීමේ ක්‍රමය අප වෙනස් කළා. අවුරුදු 1 1/2 ක් තිස්සේ මා කළ එකම සේවය නම් ලංකාව පුරා හදිසි පරීක්ෂණ පවත්වා බෙහෙත් යැවීම පිළිබඳ දූෂණ සෙවීමයි. ඒ පිළිබඳ වාර්තාව ගරු ඇමතිතුමාටත්, ස්ථිර ලේකම් තුමාටත් ඉදිරිපත් කළා. දැන් ඒ සඳහා ක්‍රම සම්පාදක මණ්ඩලයක් ඇති කර අළුත් සංවිධානයක් ඇති කර තිබෙනවා.

කලින් ආණ්ඩුවත් බෙහෙත් ගෙන්නුවා. මරදානේ තිබෙන සිවිල් මෙඩිකල් ස්ටෝර්ස් එක අවුරුදු 60 කින්වත් ලොකු කරලත් නැහැ; එතැන සේවයට ගන්න පිරිස වැඩි කරලත් නැහැ. බෙහෙත් දුම්රියෙන් යැව්වාම දුම්රිය ස්ථානවල ඒවා මාස් ගණන් තියෙනවා. සමහර තැන්වල බෙහෙත් ආරෝග්‍යශාලාවලට අරගෙන ගිහින් නැහැ. කොන්ත්‍රාත් කරුවන් අවුරුද්දකට 10 වරක් බෙහෙත් අදිනවාය කියා කොන්ත්‍රාත් එක ගත්තත්, වැඩි ලාභයක් ලබා ගන්නට, බෙහෙත් ගොඩ ගැසෙන තෙක් ඉඳ සමහරවිට අවුරුද්දකට දෙවරක් පමණයි, බෙහෙත් ගෙන යන්නේ. වැලිමඩ සහ රත්නපුරයේ ඒ තත්ත්වය තිබුණා. ඒ නිසා අප ලක්ෂ තුනහමාරක් වියදම් කර කුරුණෑගල දිස්ත්‍රික්කයට සිවිල් මෙඩිකල් ස්ටෝර්ස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එකක් සාදා අවසානයි. ඒ දිස්ත්‍රික්කයට බෙහෙත් යවන්නේ ඒ ආයතනය මාර්ග යෙන්. එතැන ගබඩා කර එතැනින් බෙදා හරිනවා. බදුල්ලටත් එවැනි ස්ථානයක් සාදා අවසානයි. බෙහෙත් පිටරටින් ගෙන ආ ඉක්මනින්ම බදුල්ලේ සෞඛ්‍ය අධිකාරි කොට්ඨාශයට අවශ්‍ය බෙහෙත් ඒ ස්ථාන යට යවනවා. ඒ ස්ථානයෙන් බදුල්ලේ සෞඛ්‍ය අධිකාරි කොට්ඨාශය තුළ ඒ බෙහෙත් බෙදා හරිනවා. ගාල්ලේ බෙහෙත් ගබඩාවක් පිහිටුවීම සඳහා රුපියල් ලක්ෂ 3 ක් පමණ වටිනා ගොඩනැගිල්ලක් ලබා ගෙන තිබෙන බව මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවෙ මයා.) දන්නවා ඇති. මා දැනට මාස 4 කට පමණ පෙර ගාලු යනවිට ඒ ගොඩනැගිල්ල දැක්කා. ඒ බෙහෙත් ගබඩාව නිසා ගාලු ප්‍රදේශයට සැලසෙන්නේ මහත් සේවාවක්. බෙහෙත් බෙදා හැරීමේ සම්පූර්ණ පරිවර්තනයක් ඇති කර මේ රජය කටයුතු කරගෙන යන නිසා දැන් කලින් පැවතියාට වඩා හොඳින් බෙහෙත් බෙදා හැරීම සිදු වෙනවා. එහෙත් බෙහෙත් ගෙන යන ආයතනවල සමහර විට දූෂණ නැත්තෙ නැහැ. ඒ බෙහෙත් ලෙඩුන්ටම නොදී පිට දෙන අවස්ථා ඇති.

මැලේරියා රෝගය ගැනත් සඳහන් වුණා. ආණ්ඩුවේ වරදකින්වත්, යම්කිසි කුමන්ත්‍රණයකින්වත් නොවෙයි, මැලේරි යාව ඇති වුණේ. ඒ රෝගයට වැඩිපුර බෙහෙත් වුවමනා කළා. හොංකොං උණය කියන රෝගය පිළිබඳ විස්තර මම පසුව ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. මෙවැනි හදිසි අවස්ථාවලදී ආරෝග්‍යශාලා, දිස්පැන්සරි ආදියට වැඩි පුර ලෙඩුන් ඇදී එනවා. සංඛ්‍යා ලේඛන අනුව මාතර දිස්පැන්සරියට මාසයකට පැමිණෙන ලෙඩුන්ගේ සාමාන්‍ය සංඛ්‍යාව 100 ක් යයි හිතමු. හදිසියෙන් යම්කිසි රෝගයක් පැතිර යාම නිසා ඒ සංඛ්‍යාව තුන් හාරසියය දක්වා වැඩි වුණොත් ඒ දිස්පැන්සරියේ සිටින ඇපෝතිකරි හෙවත් දිස්පැන්සර් මොනව කරන්නද? මුරකරුවෙකුවත්, කම්කරුවෙකුවත් දිස් පැන්සරිවල නැහැ. මේවා මනුෂ්‍ය ප්‍රශ්න. 100 කට, 200 කට බෙහෙත් කිරීමට යොදා සිටින කෙනෙකුට 300 කට, 400 කට බෙහෙත් කරන්නට සිදු වීමේදී සුළු සුළු අඩුපාඩුකම් සිදු වෙන්ට පුළුවනි.



ඒ නිසා අපි ඒ පැත්ත ගැනත් කල්පනා කර බලන්න ඕනෑ. කෙසේ වෙතත් සමාජ සේවාවක් වශයෙන් නොමිළයේ දෙන බෙහෙත් නිසියාකාරව මහජනයාට බෙදා හැරීම සඳහා විශේෂ උනන්දුවකින් ක්‍රියා කරන ලෙස සෞඛ්‍ය අධිකාරී මහත්වරුන් ටත්, දොස්තර මහත්වරුන්ටත් අනිකුත් නිලධාරීන්ටත් අප දැනටමත් අණ කර තිබෙනවා. නුසුදුසු අන්දමින් ක්‍රියා කරන යම් නිලධාරියකු සිටිනවා නම් ඔහුට විරුද්ධව පැමිණිලි ඉදිරිපත් කර ඒ පැමිණිලි විභාග කරන විට පැමිණ සාක්ෂි දීමට ඉදිරිපත් වන ලෙස ගරු මන්ත්‍රී තුමන්ලාටත් මහජනයාටත් මතක් කරන් නට කැමතියි. මන්ත්‍රී මණ්ඩලයට පැමිණ නමක් ගමක් නැතිව දොස් කියනවාට වඩා එයින් මහජනයාටත් රටටත් සෙතක් සිදු වන බව මතක් කරන්නට කැමතියි. ඒ කරුණු ඉදිරිපත් කළ මන්ත්‍රීතුමන්ලාත් ඒ බව පිළිගන්නවා ඇති.

අපේ අම්බලන්ගොඩ මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය සද්ධාසේන) ඇතුළු මන්ත්‍රීවරුන් කීප දෙනකුම ප්‍රකාශ කළා, අළුතින් දිස්පැන්සරි පිහිටුවීම සඳහා ආධාර දීම ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින් නතර කර තිබෙන බව. එය ඇත් තයි. දැනට ආරම්භ කර තිබෙන ගොඩ නැගිලිවල වැඩ කටයුතු අවසාන කිරීමට අවශ්‍ය මුදල් සපයනවා හැර අපි අනුමත කර තිබුණත් අළුතින් ගොඩනැගිලි සෑදීම සඳහා මුදල් සැපයීම දැන් අවුරුදු දෙක ක සිට ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින් නතර කර තිබෙනවා. ඒ අමාත්‍යාංශයේ අනුමැතිය ලැබුණු වහාම අපගේ අනුමැ තිය ලැබී තිබෙන අත්‍යාවශ්‍ය දිස්පැන් සරි ගොඩනැගීමට හැකි පමණ ඉක්ම ණින් ක්‍රියා කරන බව මතක් කරන්ට කැමතියි. ඇමතිතුමාට දැනුම් දී ගොඩ නැගිලි සංවර්ධනය පිළිබඳව ඒ අවශ්‍යතා වන් ඉක්මනින් ඉටු කිරීමට උත්සාහ කරනවා.

ගරු මන්ත්‍රීතුමන්ලා නොයෙක් දේවල් ගැන සඳහන් කළා. ඒවා මේ යෝජනා වට අදාළවන දේවල්ද කියා මා දන්නෙ නැහැ. "චැනල් ප්‍රැක්ටිස්" ගැන මතක් කළා. ලෙඩකු පරීක්ෂා කිරීම සඳහා දොස් තර මහත්වරු රු. 23 ක් අය කරනවාය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මිය.]

කිව්වා. පසුගිය ආණ්ඩුවේ හිටපු සෞඛ්‍ය ඇමතිතුමා විසින් තමයි, මේ ක්‍රමය ඇති කළේ. රජයේ සේවයේ යෙදී සිටින වෛද්‍යවරුන්ට පෞද්ගලිකව නිවාසවලට ගොස් රෝගීන් පරීක්ෂා කර මුදල් ලබා ගැනීමට තිබුණු නිදහස නැති කරල තම යි, මේ ක්‍රමය ඇති කළේ. පෞද්ගලික ආරෝග්‍යශාලාවකදී හෝ සමුපකාර ආරෝග්‍යශාලාවකදී හෝ ආණ්ඩුවෙන් නියම කර තිබෙන ස්ථානයකදී හෝ ලෙඩුන් පරීක්ෂා කර එක් ලෙඩකුගෙන් රු. 25ක් බැගින් අය කර ගැනීමට ඔවුන්ට ඒ අනුව අවසර දුන්නා. ඒක නීත්‍යානුකූල දෙයක්. ඒ වගේම ඒ මුදල් කෙලින්ම ඒ දොස්තර මහත්වරුන්ට යන්නෙ නැහැ. එයින් කොටසක් පමණයි ඒ මහත්වරුන්ට ලැබෙන්නෙ. ඒ නිසා එය අයුතු දෙයක් නොවෙයි. මේ විශේෂඥ දොස්තර මහත්වරුන් කියන කොටස වෛද්‍ය වෘත්තියේ යෙදී සිටින උසස්ම උදවියයි. නොයෙක් විදේශීය රටවලට ගිහින් ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා උසස් උපාධි ලබාගෙන ඇවිත් සිටින ඒ විශේෂඥ දොස්තර මහත්වරුන් ලෙඩකු පරීක්ෂා කරන්නට රු. 23 ක් ඉල්ලන වාය කියන වචනය මේ ගරු සභාව තුළ පාවිච්චි කිරීමෙන් ඒ මහත්වරුන්ට අගෞරවයක් සිදු වෙනවා. පිසිට් පත් ආදිය සකස් කරල පසුගිය ආණ්ඩුව මගින් මේ ක්‍රමය නීත්‍යානුකූලව ඇති කළ දෙයක්. අපිත් ඒක ඒ විධියටම මෙතෙක් ගෙන යනවා. ඒ නිසා එය දොස් කීමට හෝ චෝදනා නැගීමට කාරණයක් නො වෙයි.

ඊළඟට දැනට රටපුරා හැමතැනම පැතිරී යන උණ රෝගය ගැන සඳහන් වුණු නිසා ඒ ගැනත් වචනයක් කියන්නට ඕනෑ. මෙවැනි රෝග පිළිබඳව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව නිතරම විම සිල්ලෙන් සිටින බව 1969 අප්‍රේල් 28 වැනිදා දාතමින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා විසින් නිකුත් කර තිබෙන චක්‍ර ලේඛනයෙන් පැහැදිලි වෙනවා. මෙන්න ඒ චක්‍ර ලේඛනය:



"ප්‍රා. මහජන සෞඛ්‍ය චක්‍රලේඛ ලිපි අංකය: 98

මගේ අංකය: පීඑ/23/68.

1969 අප්‍රියෙල් මස 28 වෙනි දින, කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දීය.

**සියලු ආයතන භාර නිලධාරීන් වෙත.**

**ඉන්ෆ්ලුවන්ස් උණ පැතිරීයාම**

මෙරටෙහි ඉන්ෆ්ලුවන්ස් උණ වසංගතයක් ඇති වීමට ඉඩ ඇති බව දක්වමින් සෙම්ප්‍රතිශ්‍යා උණ පූර්ව සෝදිසි අනුව උපදේශ දුන් 1968.11.22 වෙනි දින නිකුත් කරන ලද අංක 95 දරණ ප්‍රාදේශීය මහජන චක්‍ර ලේඛය වෙත ඔබ අවධානය යොදනු ඇතැයි බලාපොරොත්තු වෙමි."

මේ රෝගය ලංකාවේ ඇතිවෙතැයි සෞඛ්‍ය මහජන සේවා උප අධ්‍යක්ෂ විසින් ඒ චක්‍ර ලේඛය යවා තිබෙන්නේ නොවැම්බර් 22 දායි. එහෙත් මේ රෝගය පැතිරීගෙන යන්නේ මෙම මැයි මාසයේ සිටයි. මේ ගැන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කර එයට මුහුණ දෙන්නට ලැහැස්ති වී සිටි නිසා ඉක්මණින් ප්‍රතිකාර කර වසංගත තත්ත්වයෙන් බේරෙන්නට පුළුවන් වුණා.

"1968 අවසානයේදී කරන ලද පූර්ව සෝදිසි හා එම කාලය තුළ වෛද්‍ය පර්යේෂණායතනයේ වෙත් කළාවූ සෙම්ප්‍රතිශ්‍යා උණ වයිරස් පිළිබඳව පමණක් ලෝක සෙම්ප්‍රතිශ්‍යා උණ මධ්‍යස්ථානය වාර්තා කොට ඇත්තේ, 1968 ජූලි මස පැන නැගුණු ඉන්ෆ්ලුවන්ස් උණ වසංගතය ගැන වග කිවයුතු වූ ඒ 2 හොංකොං/68 වර්ගය හා කිට්ටු සම්බන්ධයක් ඇති බවයි. 1968 අවසානයේ ඉන්ෆ්ලුවන්ස් උණ වසංගතයක් නොතිබුණද මෙම වයිරස් වර්ගය හේතුකොටගෙන බොහෝ තැන්වල විසිරුනු රෝගීන් පමණක් නොව ආයතනික පැතනැගීම් කිහිපයක් ද ඇතිවින.

1969 අප්‍රේල් 15 වෙනිදා සිට කොළඹ සහ අවට ප්‍රදේශයන්හි ඉන්ෆ්ලුවන්ස් උණ රෝගීන්ගේ ප්‍රමාණය ඉතා ඉක්මණින් වැඩි වී ගොස් ඇති බැවින් වෙනත් පළාත්වලට පැතිරීමටද ඉඩ ඇත. එහෙත් මෙතෙක් ලැබී ඇති එකම ක්ෂේත්‍ර වාර්තාව, 1969.4.14 වෙනි දින සිට රෝගීන් ප්‍රමාණය වැඩි වී ගෙන යන්නා වූ මස්කෙලිය ප්‍රදේශයෙනි. එම නිසා සියලු නිලධාරීන් විසින් ඉහත සඳහන් චක්‍ර ලේඛයෙහි දී ඇති උපදේශ පිළිපැදිය යුතු බවද පහත සඳහන් කරුණු ඉටු කළ යුතු බව ද මෙයින් දන්වා සිටිමි."

වෛද්‍ය ආයතනයට වාර්තාවක් ලැබී තිබෙන්නේ මස්කෙලියෙන් පමණයි. ඊට පසුව මේ නියෝගයත් යවා තිබෙනවා:

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙරබේරුව ආදි ස්ථානවලට ආණ්ඩුවේ බෙහෙත්ශාලා

"**වෛද්‍ය ආයතන භාර නිලධාරීන්.**

(ඒ) සෑම ආයතනයක් විසින්ම ඉන්ෆ්ලුවන්ස් උණ තත්ත්වය පිළිබඳ වාර්තාවක් අමුණා ඇති පෝරමයෙන් වසංගත රෝග විද්‍යාඥ වෙත වහා දැන්විය යුතුය. එසේම එහි පිටපතක් පළාතේ සෞ. සේ. අධි. වෙත ද යැවිය යුතුය.

(බී) යම් විධියකින් රෝග පැතිරීමක් සිදුවුව හොත් ඒ සඳහා නියමිත බෙහෙත් තොග ලබා ගැනීම සඳහා විධිවිධාන සැල සිය යුතුය.

(සී) ප්‍රාදේශීය හා මූලික රෝහල් හි වෛද්‍ය වරුන් විසින් වාට්ටුවල නතර කරන ලද රෝගීන් හදාරා, වයස් ප්‍රමාණ, චිකිත්සික ලක්ෂණයන් පැවති කාල සීමාව, රෝග ගැටළු උණ හා මරණ සංඛ්‍යාව යනාදී කරුණු ඇතුළත් කෙටි වාර්තාවක්, එම රෝග පැතිරීම මර්ධන වූ පසු, සැපයිය යුතුය.

රෝගීන් ප්‍රමාණයේ වැඩිවීමක් නොතිබුණු ආයතනවල යම් හේතුවකින් වැඩිවීමක් තේරුම් ගියහොත්, ඒ බව වහාම දැන්විය යුතුය."

මෙන්න මේ කාලයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට විශේෂයෙන් දී තිබෙන නියෝගයක් :

"**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්.**

(1) ආයතනවලින් සතියකට වරක් දන්වනු ලබන රෝගීන් ප්‍රමාණය සෑම වෛද්‍ය නිලධාරි යෙකු විසින්ම චක්‍රලේඛ මගින් සටහන් කොට තම පළාත්වල රෝගය විකාශනය හැදෑරිය යුතුයි. තම පළාතේ විශාල පාසැල්වල ළමුන්ගේ නො පැමිණීම පිළිබඳ සොයා බැලීමෙන් මෙම වසංගත යේ ප්‍රමාණය හා කාලසීමාව දැනගත හැක. වසංගතය මර්ධනය වූ පසු සෑම නිලධාරියෙකු විසින්ම ඒ පිළිබඳ වාර්තාවක් සැපයිය යුතුය."

ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙකු විසින්ම තම තමන්ගේ කොට්ඨාශවල ඉන්ෆ්ලූවන්ස් උණ රෝගය ගැන කිව්වා. 1968 නොවැම්බර්වල සිටම මෙවැනි රෝගයක් ලංකාවේ ඇති වුණොත් එය මර්ධනය කරන්නට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සෑම පියවරක්ම අරගෙන තිබුණු නිසයි එය වසන්ගතයක් බවට පත් නොවී මර්ධනය කර ගන්නට හැකි වූයේ කියා සඳහන් කරන්නට කැමතියි.

ඒ සමගම බාහිර දිස්පැන්සරි පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ කරුණුත් ගරු ඇමතිතුමාට ඉදිරිපත් කර ඒ ගැනත් සුදුසු පරිදි කටයුතු කරන්නට බලාපොරොත්තු වන බව මතක් කරන්නට කැමතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

Is the hon. Member for Hiriyala accepting the amendment of the hon. Member for Dambulla ?

**එස්. බී. හේරත් මයා.**

*(திரு. எஸ். பி. ஹேரத்)*

(Mr. S. B. Herat)

Yes.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

I shall now put the amendment to the House. The amendment is, after "Diddeniya" to insert "Lenadora, Aluthgama, Nagahapola and Millawana."

**එම වචන එතැනට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

குறித்த சொற்கள் சேர்க்கப்படவேண்டுமெனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question, that those words be there inserted, put, and agreed to.*

**සංශෝධනය කරන ලද මුල් ප්‍රශ්නය, එනම් :**

දෙරබේරුව, දූගම, සීරාදුන්න, හුණුපොල, දිද්දෙනිය, ලේනදෙර, අළුත්ගම, නාගහපොළ හා මිල්ලවානේ රෝහල් හා ප්‍රවාහණ පහසුකම් නැති බැවින් එම ප්‍රදේශවල ආණ්ඩුවේ බෙහෙත්ශාලා පිහිටුවිය යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි.

**විමසන ලදින්, සභාසම්මත විය.**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

திருத்தப்பட்டவாறன மூலவினு :

தொற போருவ, தமக, தீறதுன்ன, ஹீனுப்பொல தித்தெனிய, லேனகொற, அழுத்கம, நாகஹபொல மில்லவான ஆகிய இடங்களில் வைத்தியசாலையோ போக்குவரத்து வசதிகளோ இல்லாதிருப்பதை முன்னிட்டு அவ்விடங்களில் அரசினர் மருந்தகங்கள் நிறுவப்படவேண்டுமென இச்சபை கருதுகிறது.

விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Main Question, as amended, viz :*

"That in view of the absence of a hospital and transport facilities in Doraberuwa, Dagama, Seeradunna, Hunupola, Diddeniya, Lenadora, Aluthgama, Nagahapola and Millawana, this House is of opinion that government dispensaries should be established in these areas."

*put, and agreed to.*

## නිකදලුපොත තැපැල් කාර්‍යාලය

*நிக்கதலுப்பொத்தவில் தபால் நிலையம்*

## POST OFFICE AT NIKADALUPOTA

අ. භා. 3.47

**එස්. බී. හේරත් මයා.**

*(திரு. எஸ். பி. ஹேரத்)*

(Mr. S. B. Herat)

නියෝජ්‍ය කථානායකතුමනි, මා නමින් තිබුණු පළමු යෝජනාව ඉංග්‍රීසියෙන් ඉදිරිපත් කිරීම ගැන හබරාදූවේ ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) මට චෝදනා කළා. මා සාමාන්‍යයෙන් සිංහල හා ඉංග්‍රීසි යන භාෂා දෙකෙන්ම කථා කරනවා. හබරාදූවේ ගරු මන්ත්‍රීතුමා නම් ඉංග්‍රීසියෙන් කථා කරන්නේ උසාවියේ පමණයි. මා සාමාන්‍යයෙනුත් ඉංග්‍රීසියෙන් හා සිංහලයෙන් කථා කරන නිසාත්, මෙය මුදල් අය කරන කථාවක් නොවන නිසාත් මොන භාෂාවෙන් කථා කළත් කමක් නැහැ නොවැ? එහෙත් හබරාදූවේ ගරු මන්ත්‍රීතුමා නම් ඉංග්‍රීසියෙන් කථා කරන වාට කැමැති ඇති.

ඒ කොහොම වුණත් මගේ නමින් තිබෙන පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා :

නිකදලුපොත තැපැල් කාර්යාලය වශයෙන් දැනට පාවිච්චි කරන ගොඩනැගිල්ල අබලන් තත්ත්වයක තිබෙන බැවින්, එම තැපැල් කාර්යාලය සඳහා අලුත් ගොඩනැගිල්ලක් වහාම ලබා දිය යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි.

මේ සඳහා මුදලුත් සම්මත වී තිබුණා. ඉඩමක් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය පමණයි තිබෙන්නේ. එම නිසා මෙය ඉක්මණින් ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ඇමතිතුමා කටයුතු කරනු ඇතැයි මා විශ්වාස කරනවා. මීට වඩා දීර්ඝ කථාවක් කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ.

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

**විසින් සපිර කරන ලදී.**

*அனுவதித்தார்.*

*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினு விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## නිකදලුපොත තැපැල් කාර්‍යාලයට තැපැල් පියන්වරු

*நிக்கதலுப்பொத்த தபால் நிலையத்திற்குத் தபால் சேவகர்கள்*

## POSTAL PEONS FOR NIKADALUPOTA POST OFFICE

**එස්. බී. හේරත් මයා.**

*(திரு. எஸ். பி. ஹேரத்)*

(Mr. S. B. Herat)

මා නමින් තිබෙන පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැඩිවන ජනගහනය ආදිය නිසා නිකදලුපොත තැපැල් කාර්යාලයේ වැඩ සැළකිය යුතු ප්‍රමාණය කින් වැඩි වී ඇති බැවින්, එම තැපැල් කාර්යාලයට අතිරේක පියන්වරු දෙදෙනෙකු පත් කළ යුතුයයි, මෙම මන්ත්‍රි මණ්ඩලය අදහස් කරයි.

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)

*(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)*

(Mr. M. Tennakoon—Nikaweratiya)

**විසින් සථිර කරන ලදී.**

*அனுவதித்தார்.*

*seconded.*

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

හිරියාල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව වැඩි වන ජනගහනය අනුව ඉදිරිපත් කරන්නක්. ජනගහනය වැඩි වන්නේ හිරියාලේ පමණක් නොවෙයි. මුළු ලංකාව පුරාම ජනගහනය වැඩි වෙනවා. එම නිසා පහත සඳහන් අතුරු යෝජනාව මා ඉදිරිපත් කරනවා :

"වැඩි වන ජනගහනය අනුව ලංකාවේ හැම තැපැල් කාර්යාලයකටම අතිරේක පියන්වරුන් හා අනෙකුත් සේවකයන් බඳවා ගත යුතු යයි, මෙම මන්ත්‍රි මණ්ඩලය අදහස් කරයි."

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

Is the hon. Member for Hiriyala accepting the amendment ?

**එස්. බී. හේරත් මයා.**

*(திரு. எஸ். பி. ஹேரத்)*

(Mr. S. B. Herat)

No.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

If the hon. Member is not accepting the amendment, I rule it out of Order.

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

එහෙම නම්, අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය සද්ධාසේන) කීවා වාගේ ක්‍රම සම්පාදන මණ්ඩලය නමැති කෙහෙල්මලටවත් මොකක් හෝ කරන්න පුළුවන් නම් හොඳයි. මගේ අතුරු යෝජනාව භාර නොගත්තත්, හිරියාල ගරු මන්ත්‍රීතුමාගේ මුල් යෝජනාව පිළිගන්නවා නම් හැම තැනකම ඒ තත්ත්වය තිබෙන බව පිළිගත යුතුයි.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

But I cannot allow an amendment unless the Mover is accepting it.

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

එහෙම නම් අප ඒ ගැන පසුව යෝජනාවක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. මගේ අතුරු යෝජනාව හිරියාලේ මන්ත්‍රීතුමා භාර ගත්තා නම් මේ සම්බන්ධව මට කරුණු කීපයක් ප්‍රකාශ කරන්නට තිබුණා. එහෙත්, දැන් විශේෂ යමක් කියන්නට ඉඩක් නැති නිසා මා නවතිනවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரீ. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

වැඩි වන ජනගහනය අනුව මුළු ලංකාවේම තැපැල් පහසුකම් හා වෙනත් අඩු පාඩු සම්පූර්ණ කෙරෙතොත් ඉතාම හොඳයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

එසේ නොහැකි නම්, නිකදළුපොත කොටසේ මිනිසුන්ටවත් හරියාම වරදක් නැහැ. එම නිසා මේ යෝජනාවට පක්ෂ වීම සුදුසුයි.

ශත 10 මුද්දරයක් අලවා අප විසින් තැපැල් කරනු ලබන ලියුම්, ලැබිය යුතු අයගෙන් බොහෝ දෙනකුට ඒවා තම තමන්ගේ ගෙදරටම, අතටම ලැබෙනවා. එහෙත් තවත් පිරිසකට ඒ විධියට අතටම ලියුම් ලැබෙන්නේ නැහැ. එවැනි අය එක්කෝ අතරමග කඩයකට ගොස් ඔවුන්ගේ ලියුම් ලබා ගත යුතුයි. එසේ නැත්නම්, ළඟපාත දන්නා අඳුනන ගෙදරකට ගොස් ඒවා ලබා ගන්නට ඕනෑ. ඒත් නැත්නම්, තැපැල් කාර්යාලයටම ගොස් ලබා ගන්නට ඕනෑ. එම නිසා තම තමන්ගේ ලියුම් තම අතටම ලැබෙන අන්දමට ලියුම් බෙදීමේ ක්‍රමයක් ඇති කිරීම ඉතාම වැදගත් බව මා ප්‍රකාශ කරන්නට ඕනෑ. තැපැල් ඇමතිතුමා හෝ එතුමාගේ උප ඇමතිතුමා හෝ මෙහි නැතත් ඉස්සරහ පේළියේ තිබෙන හිස් පුටුවලටවත් ඇහෙන්නට මේ අදහස් ප්‍රකාශ කිරීම හොඳයයි මා අදහස් කරනවා. නිකදළුපොත තැපැල් කාර්යාලයට පියුන්වරුන් දෙදෙනකු ලැබීම ගැන අපගේ විරුද්ධත්වයක් නැහැ. ඇමතිවරුන් මෙහි නැතත් හැන්සාඩ් මගින්වත් මෙම අදහස් ඇමතිවරුන්ට ඇසේවා, ඒ අනුව එම අඩු පාඩුකම් සම්පූර්ණ වේවා යනුවෙන් මා ප්‍රාර්ථනා කරනවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## පොල්ගහන්ගොඩ-රඹේ ර. වැ. දෙ. පාර

பொல்ககன்கொட—றம்பே அ. க. வே. திணைக் களப்பாதை

## POLGAHANGODA-RAMBE P. W. D. ROAD

අ. භා. 3.54

**එස්. බී. හේරත් මයා.**

*(திரு. எஸ். பி. ஹேரத்)*

(Mr. S. B. Herat)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නමින් තිබෙන යෝජනාව මෙසේයි:

"පොල්ගහන්ගොඩ-රඹේ ර. වැ. දෙ. පාරේ බස් සේවයක් පටන් ගැනීමට හැකිවන පිණිස එම පාරේ ශක්තිමත් නැති බෝක්කු ශක්තිමත් කර පාරේ ඉතිරි කොටස අලුත්වැඩියා කර තාර දැමිය යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

හැතැප්ම 9 ක් දිග ඇති මෙම පාරේ වැඩ කටයුතු දැන් හුඟක් දුරට කෙරී තිබෙනවා. තව බෝක්කු දෙකක පමණක් වැඩ කරන්නට තිබෙනවා. එය අවසාන කළ විට, දැනට මිනිසුන්ට පයින් ගමන් කරන්නට සිදු වී තිබෙන හැතැප්ම 10 ක් පමණ වන කොටසෙහි බස් රථයක් ගමන් කරන්නට පුළුවන් වෙනවා. එම නිසා මෙය ඉතා ඉක්මනින් සම්පූර්ණ කළයුතුයයි මා ප්‍රකාශ කරනවා.

**එස්. ද එස්. ජයසිංහ මයා.**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*

(Mr. S. de S. Jayasingha)

හිරියාලේ මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරන ගමන් ඒ පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්නට මා අදහස් කරනවා. මෙය, පොල්ගහන්ගොඩ-රඹේ ර. වැ. දෙ. පාරේ ශක්තිමත් නැති බෝක්කු ශක්තිමත් කොට පාරේ ඉතිරි කොටස අලුත්වැඩියා කර තාර ඇමීමට ඉදිරිපත් කර තිබෙන යෝජනාවක්. මෙවැනි පාර වල ඇති අබලන් පාලම් බෝක්කු ශක්තිමත් කිරීම රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ යුතුකමක් බව අප දන්නවා. එහෙත් මෙහි එක්තරා ප්‍රශ්නයක් තිබෙනවා. අඩි 10 ක පමණ බෝක්කුවක් ශක්තිමත් කිරීමට රජයේ වැඩ දෙපාර්තමේන්තුව අද පටන්ගත්තොත් එය අවසන් වෙනවා ඇත්තේ ලබන මැතිවරණයටත් පසුවයි. එම නිසා පාලම් බෝක්කු ආදිය ශක්තිමත් කිරීමේදී මීට වඩා ක්‍රමානුකූලවත් ඉක්මනිනුත් එය කර ගැනීමේ වැඩ පිළිවෙළක් ගැන අපේ සිත යොමු කරන්න ඕනෑ. අද අපේ අත්දැකීම, අපේ පමණක් නොවෙයි, මීට කලින් බලයේ සිටි ආණ්ඩුවලත් අත්දැකීම, රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් කරන්නට ආරම්භ කරන කුඩා පාලමක වැඩ කටයුත්තක් වුණත් එය සාදා අවසන් කිරීමට අවුරුදු ගණනාවක් ගත වන බවයි. මෙය ඉතාම පුදුම සහගත දෙයක්.

මගේ ඡන්ද කොට්ඨාශයේ මායිමේ බෙල්ලන්විල කුඩා පාලමක් තිබෙනවා. [බාධාකිරීම්] වසා දමනවාට වඩා යමක් කරන්න කියනවා නම් ඒකත් හොඳයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අත්තිඩියට යාම පිණිස ඇති උස් ඒදණ්ඩ කියන කුඩා පාලම ගැනයි මා සඳහන් කරන්නෙ. උස් ඒදණ්ඩ කියන්නේ එය උස නිසයි. ඒ කාලයේ ඒක යටින් පාරු ගමන් කළා. ජල මට්ටම ඉහළ නඟින විට පවා පාරු ගමන් කිරීමට හැකි විය යුතු නිසයි එසේ උසට සාදා තිබුණෙ. එහෙත් දැන් අවුරුදු කීපයකට ඉහතදී සිට පාරු ගමන නැවතී තිබෙන නිසා ඉහළට ගොස් පහළට යන සේ ඒ තරම් උසට වුවමනා නැත යන පදනම උඩ එය පහත් කිරීමට ඒ පාලම කැඩුවා. පළමුවෙනි අවුරුද්දෙ පහත් කළා, දෙවෙනි අවුරුද්දෙත් පහත් කළා. තුන්වෙනි අවුරුද්දෙ අවසන් වුණා. අවුරුදු තුනක් ගත වුණා. ඒ නිසා හිරියාල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව කොයි තරම් ඉක්මනින් ක්‍රියාත්මක වේවිද කියා මා දන්නෙ නැහැ.

අඩි 20 ක් පමණ දිග අඩි 20 ක් පමණ පළල කුඩා පාලමක් ශක්තිමත් කිරීමට රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අවුරුදු 3ක් ගත වුණා නම්, ඊට වැය වී තිබෙන වියදම කොයි තරම්ද බැලුවොත් සමහර විට ඔය කියන පාරේ තිබෙන සියලුම පාලම් සහ බෝක්කු එයින් ශක්තිමත් කිරීමට පුළුවන් බව තමුන්නාන්සේට ඒත්තු යනවා ඇති. ඒ නිසා ඇමතිතුමා මෙහි නොසිටියත්, දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වාගේ ඇමතිතුමාට කඩදාසි පොතෙන්වත් බලා ගැනීමට අපි මේවා ප්‍රකාශ කරන්න ඕනෑ.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව, නියෝජ්‍ය කථානායකතුමනි, මුළු රටේම රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයිති සෑම පාරක්ම නඩත්තු කිරීමට භාරගෙන තිබෙන දෙපාර්තමේන්තුවක්. එම පාරවල තිබෙන පාලම් සහ බෝක්කු නඩත්තු කිරීමත් අයිති එම දෙපාර්තමේන්තුවටමයි. මේවා මෙහිදී කියාත් බැහැ, නොකියාත් බැහැ. දැන් මේ පාර්ලිමේන්තු වාරයේ ආයුෂ අවුරුදු 4 ක් වෙනවා. කොහුවල හන්දියේ සිට දකුණු කොළඹ මහ රෝහල දක්වා ඇති හැතැප්ම භාගයක් පමණ වූ සුළු දුර ප්‍රමාණයේ මාගී කොටස පළල් කර ගැනීමට අද වන තුරුත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබෙනවා. මේ ප්‍රදේශයේ මන්ත්‍රීවරයා හැටියටත් මා කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඊට පළමුවෙන් නගරාධිපති හැටියට නගර සභාවෙනුත් ඉදිරිපත් කර තිබෙනවා. ඉතාමත්ම අදක්ෂ වූ, ඉතාමත්ම කම්මැලි ගොළුබෙලි ගමනින් යන දෙපාර්තමේන්තුවක් තිබෙනවා නම් එය මේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගල් රෝලේ ගමනින්.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)
ගල් රෝලටත් හෙමින්.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please. The Sitting is suspended till 4.30 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.**

அதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.*

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාවේ ගණපූරණයක් නැහැ.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන් බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

சபை கணிக்கப்பட்டு நிறைவெண் இன்மையால், பிரிவு மணி அடிக்கப் பணிக்கப்பட்டது.

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

පසුව ගණපූරණයක් නොතිබුණෙන්, නියෝජ්‍ය කථානායකතුමා විසින් 11 වන ස්ථාවර නියෝගය යටතේ, ප්‍රශ්නය නො විමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 4.36 ට, 1969 මැයි 5 වන සඳුදා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.



*பின்னர் நிறைவெண் சேராததனால் உப சபாநாயகர் அவர்கள், நிலையற் கட்டளை இல. 11 இன்படி வினாவின்றிச் சபையை ஒத்திவைத்தார்கள்.*

*இதன்படி, பி. ப. 4.36 க்கு, 1969 மே 5, திங்கட்கிழமை பி. ப. 2 மணி வரை சபை ஒத்திவைக்கப்பட்டது.*

*Later, a Quorum not being present,* MR. DEPUTY SPEAKER *adjourned the House, without Question put, under Standing Order No. 11.*

*Adjourned accordingly at 4.36* P.M. *until 2* P.M. *on Monday, 5th May 1969.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා
රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි.
පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම්
කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு
ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்.
தனிப்பிரதி சதம் 30, தபால் மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு
அலுவலக அத்தியட்சரிடம் (த.பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org